*(නිල නොවන සිංහල පරිවර්තනය)*

# මානව හිමිකම් කවුන්සල අභියෝජනා අංක 16/21 හි ඇමුණුමේ 5 වන ඡේදය ප්‍රකාරව ඉදිරිපත් කෙරෙන ජාතික වාර්තාව ශ්‍රී ලංකාව

**(1)** හැඳින්වීම

**පසුබිම**

1. මානව හිමිකම් සංවර්ධනයෙහිලා වැදගත්වන සංක්‍රාන්ති කාලපරිච්ඡේදයක් ශ්‍රී ලංකාව පසු කරමින් සිටී. 2015 වර්ෂයේ ජනවාරි මාසයේ පවත්වන ලද ජනාධිපතිවරණයේදී ප්‍රජාතන්ත්‍රවාදී ලෙස බලහුවමාරුවක් සිදුවී නව සන්ධාන රජයක් බලයට පැමිණියේය. ඉන්පසුව 2015 අගෝස්තු මස පැවති මහමැතිවරණයෙන් වත්මන් ආණ්ඩුව බලයට පත්විය.

2. 2015 වර්ෂයේ සිට ව්‍යවස්ථා හා පරිපාලන ප්‍රතිසංස්කරණ රාශියක් තුලින් පුළුල් ප්‍රජාතන්ත්‍රවාදී ඉඩකඩක් විවර විය. මේ ප්‍රතිසංස්කරණ අතර මාධ්‍ය නිදහස තහවුරු කිරීම හා 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය තුලින් ආයතනයන් හි ස්වාධීනත්වය තහවුරු කිරීම ඇතුලත් වෙයි. නව රජය ගැටුම් අවසන්වීමෙන් පසු දේශපාලන අභියෝගයන්, සාමය හා සංහිඳියාව යන ජාතික මට්ටමේ ගැටළු වලට විසඳුම් සොයා ගැනීම පිණිස කැපවී සිටී.

3. ශ්‍රී ලංකාව සිය තුන්වන කාලාන්තරීය විශ්ව සමාලෝචනයට සහභාගී වීමට අවස්ථාව ලැබීම ගැන සිය සතුට පළ කරයි. වසර 2012 දී සිදුකරනු ලැබූ ශ්‍රී ලංකාවේ දෙවන කාලාන්තරීය විශ්ව සමාලෝචනයෙන් පසුව සහ වසර 2015 දී නව රජයක් බලයට පැමිණීමෙන් පසුව මේ දක්වා ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ආරක්ෂා කිරීම හා ප්‍රගතිය ගෙනහැර දැක්වීමට මෙම වාර්තාවේ අරමුණ වේ. වාර්තාව සකස් කරනු ලැබ ඇත්තේ ප්‍රධාන වශයෙන් වසර 2008 දී හා වසර 2012 දී පළමු හා දෙවන කාලාන්තරීය විශ්ව සමාලෝචන අතරතුර ශ්‍රී ලංකාව වෙත කරනු ලැබූ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම වෙත අවධානය යොමු කරමිනි.

**ජන සංයුතිය**

4. ශ්‍රී ලංකාවේ ජනගහනය, 2013 මධ්‍ය වර්ෂය වන විට 20,483,000 කි. එයින් 51.5% ගැහැණුද, 48.5 පිරිමිද විය. බහු වාර්ගික හා බහු ආගමික රටක් වන මෙහි සිංහල 74.9%, දෙමළ හා මුස්ලිම් පිළිවෙලින් 11.2% හා 9.3% වශයෙන් විය. වතුකරයේ පදිංචිව සිටින දමිළ ජනතාව ඉතිරි 4% අයත් වේ. ප්‍රධාන ආගම් වර්ග 04කි. බෞද්ධාගමිකයන් 70% හින්දු 12.6, ඉස්ලාම් 9.7% හා ක්‍රිස්තියානු භක්තිකයන් 7.6% කින් ජනගහනය සමත්වේ.

5. ශ්‍රී ලංකාවේ ජනගහන වර්ධන වේගය 0.8 අගයක් ගනී. මිලියන 5.1 වයස 0-14 අතරද, මිලියන 13.7 වයස 15-64 අතරද, මිලියන 1.6 වයස අවුරුදු 65 ට වැඩි ආදී වශයෙන් වේ. 2014 වර්ෂයට අනුව වර්ග කිලෝ මීටරයකට ජන ඝනත්වය පුද්ගලයන් 332 කි.

6. සාක්ෂරතාවය අතරින් ඉහල අගයක් ශ්‍රී ලංකාව සතුය. 2012 වර්ෂයේ දී එය සාමාන්‍යයක් ලෙස 95.6% කි. පිරිමින් 96.8% ද කාන්තාවන් 94.6% වශයෙන් එය සමන්විතය. 2014 වර්ෂය වන විට 99.7%, ප්‍රාථමික අධ්‍යාපනය ලබයි.

7. ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය දර්ශකද බලාපොරොත්තු තැබිය හැකි ස්ථානයක ඇත. උපතේ දී ආයු අපේක්ෂාව වසර 76කි. ළදරු මරණ අනුපාතය (සජීවී උපත් දහසකට: 2012 වර්ෂය) පූර්ව ප්‍රසව, ළදරු හා වසර 5ට අඩු වයස් කාණ්ඩ පිළිවෙලින් 6.8, 9.2 හා 10.4 කි. මාතෘ මරණ අනුපාතය (සජීවී උපත් 100,000ට) 2010 වර්ෂයේ දී 33කි. මෙය 1990 වර්ෂයේ මරණ අනුපාතය වූ 100 හා සසඳන විට සාධනීය වර්ධනයකි.

(2) **ක්‍රමවේදය හා අදහස් විමසීම**

8. වාර්තාව පිළියෙල කිරීමට යොදාගත් ක්‍රමවේදය දෙයාකාරය. පළමු අදියර වශයෙන් අදාල රාජ්‍ය ආයතන සමග පැවැත් වූ සාකච්ඡා වට වලට අනතුරුව අවශ්‍ය තොරතුරු ලබාගැනීම සිදු වූ අතර, දෙවැනි අදියරේ දී රාජ්‍ය නොවන සංවිධාන හා සාමාජිකයන් සමග සාකච්ඡා පවත්වා, සිවිල් සමාජයේ අදහස් ද විමසා වාර්තාව සකස් කරන ලදී.

**<u>දත්ත එකතු කිරීම සහ සැකසීම</u>**

9. අදාල රාජ්‍ය නිලධාරීන්ගෙන් සමන්විත අන්තර් අමාත්‍ය අනුකමිටුවක් විසින් පසුගිය කාලාන්තරීය විශ්ව සමාලෝචන චක්‍රයන් දෙකෙහි දී ශ්‍රී ලංකාවට කරන ලද නිර්දේශයන් මත පදනම්ව තොරතුරු ලබා ගැනීම හා එම තොරතුරු සමාලෝචනය කරමින් වාර්තාකරණ අවශ්‍යතාවයට අනුව සකස්කිරීම සිදුවිය. මෙම සම්බන්ධීකරණ කටයුතු විදේශ කටයුතු අමාත්‍යාංශයේ, එක්සත් ජාතීන්ගේ අංශය විසින් සිදුකරන ලදී.

10. මෙහිදී වැඩි අවධානයක් යොමු කෙරුණේ 2012 කාලාන්තරීය විශ්ව සමාලෝචන චක්‍රයේ ශ්‍රී ලංකාව ඉටුකිරීමට එකඟ වූ නිර්දේශයන් මෙන්ම ස්වෙච්ඡාවෙන් දෙන ලද ප්‍රතිඥා වෙතය. ශ්‍රී ලංකාවට 2012 වර්ෂයේදී කරනු ලැබූ නිර්දේශයන්ගෙන් ක්‍රියාත්මක කිරීමට ඉතිරිව ඇති ඒවාද 2008 වර්ෂයේ ශ්‍රීලංකාව විසින් ස්වෙච්ඡාවෙන් දෙන ලද ප්‍රතිඥාද ශ්‍රී ලංකාවට කරනු ලැබූ නිර්දේශයන්ගේද, වැඩිපුර තොරතුරු රැස්කරගන්නා ලදී. තොරතුරු මූලාශ්‍රයන් දෙකක් මත මෙම වාර්තාව පදනම් වී ඇත.

(a) විදේශ කටයුතු අමාත්‍යාංශය අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු අතර සම්බන්ධීකරණයෙන් ලබාගත් තොරතුරු

(b) ශ්‍රී ලංකාවට කාලාන්තරීය විශ්ව සමාලෝචනයන්හිදී කෙරෙන ලද නිර්දේශ කුමන ප්‍රමාණයකින් 2017-2021 සඳහා වන ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත්වීදැයි විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් අධ්‍යයනය කරන ලදී. වර්ෂ 2016දී එම ක්‍රියාකාරී වැඩසටහන සැකසීමේ ක්‍රියාවලියේදී එම නිර්දේශයන් මෙම ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් කරගන්නා බවට එකඟත්වයක් වූයේය.

**<u>අදහස් විමසීම</u>**

**ජාතික මට්ටමේ**

11. මෙම වාර්තාව සකස් කිරීම අරමුණු කරගනිමින් අදියර දෙකක් යටතේ ජාතික මට්ටමින් මානව හිමිකම් පිලිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම පිලිබඳ අදහස් විමසීම සැලකිය හැක. එම කාර්ය සාධක වාර්තාවට කාලාන්තරීය විශ්ව සමාලෝචන නිර්දේශයන් පදනම් කරගන්නා ලදී.

a) මානව හිමිකම් පිලිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවලියේ මූලික සම්බන්ධීකරණය හා උපදේශකත්වය සඳහා රාජ්‍ය සමායෝජන කමිටුව හා සිවිල් සංවිධාන සමායෝජක කමිටුව ස්ථාපිත කිරීම.

b) රාජ්‍ය හා සිවිල් සංවිධාන සාමාජිකයන් නියෝජනය වන සේ කෙටුම්පත් කමිටු 10ක් පිහිටුවීම.

c) මානව හිමිකම් පිලිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් කළ යුතු ක්‍රියාකාරී අංග පිළිබඳව මහජන අදහස් ලබා ගැනීම සඳහා නිල වෙබ් පිටුවක් විවෘත කිරීම.

d) ශ්‍රී ලංකාවේ වර්තමාන මානව හිමිකම් තත්වයට අදාල නිරීක්ෂණ හා නිර්දේශයන් ලබා ගැනීම සඳහා සිවිල් සමාජයේ හා පොදු ජනතාව නියෝජනය වන ලෙස අදහස් විමසීම් පැවැත්වීම

(e) මානව හිමිකම් පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්මේ කෙටුම්පත අදාල අමාත්‍යාංශයෙන්, මානව හිමිකම් කොමිසම, එක්සත් ජාතීන්ගේ ආයතන හා මානව හිමිකම් පිළිබඳ විශේෂඥයන් අතර බෙදා හැරීම මගින් වාර්තාව සම්බන්ධ ප්‍රතිචාර ලබාගත් අතර, එම නිරීක්ෂණ පසුව වාර්තාවට ඇතුළු කරන ලදී.

12. එසේ ලබාගත් තොරතුරු පදනම් කරගනිමින්, දත්ත රැස්කිරීම හා සංකලනය තුලින් ජාතික වාර්තාව සකස් කරන ලදී. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමසාරිස් කාර්යාලය, ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨ උපදේශකවරයා හා සම්බන්ධ වෙමින් වාර්තාවේ සැකැස්ම හා පිළිගැනීම පිළිබඳ උපදෙස් ලබාගන්නා ලදී.

<u>අවසාන වාර්තාව සකස් කිරීම</u>

13. සියලු දත්ත රැස් කරගැනීමෙන් හා ජාතික මට්ටමේ අදහස් විමසීම් පැවැත්වීමෙන් අනතරුව, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිමේ 16/21 අංක දරණ 2011 ජුලි 19 දින අභියෝජනාවෙහි ඇති මාර්ගෝපදේශ වලට අනුකූලව, තෙවැනි කාලාන්තරීය විශ්ව සමාලෝචන චක්‍රයට අදාල ජාතික වාර්තාව පිළියෙල කරන ලදී.

3) **නෛතික හා ආයතනික රාමුව**

**A. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා හා නීති රාමුව**

<u>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව</u>

**2008 වර්ෂයේ කාලාන්තරීය විශ්ව සමාලෝචන වාර්තාව ස්වෙච්ඡා ප්‍රතිඥා - පරිච්ඡේදය 9**

14. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ද්විත්ව ආකෘතියක් දරන නිසා, ශ්‍රී ලංකාවේ අන්තර්ජාතික ගිවිසුම් පිළිබඳ වගකීම් ක්‍රියාවට නැංවීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇති ප්‍රතිපාදන, දේශීය නීති හා රෙගුලාසි හරහා සිදුකරනු ලැබේ. ශ්‍රී ලංකාව පාර්ශවයක් බවට පත්ව ඇති අන්තර්ජාතික සම්මුතීන් පිළිගැනීම නෛතික, ව්‍යවස්ථාමය හා අධිකරණ ක්‍රියාවලින් හරහා සිදුකෙරේ.

15. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයකින් සමන්විතය. එහි සිතීමේ, හෘදය සාක්ෂියේ හා ආගමික නිදහස, කෲර වදහිංසාවලට ලක්නොවීමේ නිදහස, සර්ව සාධාරණත්වයේ අයිතිය, අත්තනෝමතිකව සිරභාරයට ගැනීමෙන් රඳවා තැබීමෙන් හා දඬුවම් කිරීමෙන් නිදහස, භාෂණයේ, සාමකාමීව රැස්වීමේ හා යාම් ඊමේ නිදහස ඇතුලත්වේ. ජීවත්වීමේ අයිතිය මෙම පරිච්ඡේදයේ ප්‍රකාශිතව සඳහන්වී නැත. එහෙත් ඉද්දමල්ගොඩට එරෙහිව ශ්‍රියානි සිල්වා (2005) 2 SLR 63 ප්‍රකාරව ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ජීවත්වීමේ අයිතිය වක්‍රාකාරව පිළිගෙන ඇත.

16. ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේ කොටසක් ලෙස මූලික අයිතිවාසිකම් පිළිබඳ නව නීති කෙටුම්පතක් කෙරෙහි අවධානය යොමු වී ඇත. මූලික අයිතිවාසිකම් උදෙසා පිහිටුවා ඇති පාර්ලිමේන්තු අනු කමිටුව දැනටමත් තම අවසාන වාර්තාව ව්‍යවස්ථා සභාවට භාරදී ඇත. එහි ජීවත්වීමේ අයිතිය හා පුද්ගලිකත්වයට ඇති අයිතිය විශේෂයෙන්ම සඳහන් කර ඇත. තවද, දැනට ව්‍යවස්ථාවේ ඇති සර්ව සාධාරණත්වයේ අයිතිවාසිකම පුළුල් කරමින්, ලිංගිකත්වය, ලිංගික දිශානතිය හා ආබාධිතබවත් සර්ව සාධාරණත්වයේ අයිතිවාසිකමට ඇතුළු කර ඇත.

<u>කෲර වදහිංසාවට එරෙහි සම්මුතිය පනත හා සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය පනත</u>

17. ශ්‍රී ලංකාව ඇතැම් ප්‍රධාන අන්තර්ජාතික මානව හිමිකම් ගිවිසුම් එළැඹ ඒවා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය දේශීය පනත් හඳුන්වා දී ඇත. ඒ අතර කෲර වදහිංසාවට එරෙහි සම්මුතිය සඳහා 1994 අංක 22 දරන කෲර වදහිංසාවට එරෙහි සම්මුතිය පනත සහ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය සඳහා 2007 අංක 56 දරන සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය

පනත මූලික තැනක් ගනී. මෙම දෙවන පනතේ ඇතැම් වගන්ති ව්‍යවස්ථාවේ ප්‍රකාශිතව හෝ අප්‍රකාශිතව නොමැති ඇතැම් අයිතිවාසිකම් තහවුරු කිරීමට සමත් වී ඇත. නිදසුනක් ලෙස සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය පනතෙහි සඳහන් 'ළමයාගේ උපරිම ශුභ සිද්ධියට ප්‍රමුඛත්වය දීම' යන සංකල්පය දැක්විය හැක.

18. සිය අයිතිවාසිකම් උල්ලංඝනය වූ අවස්ථාවක ශ්‍රී ලාංකිකයන් විසින් අනුගමනය කළහැකි පියවර කිහිපයක් වේ. රජයේ විධායක හෝ පරිපාලන ක්‍රියාවක් මගින් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වූ අවස්ථාවක ඒවා කිරීමේ බලය ශ්‍රේෂ්ඨාධිකරණය සතුය. අගතියට පත් ඕනෑම පාර්ශ්වයක් තමා විසින්ම හෝ නීතිඥයෙකු මාර්ගයෙන්, උල්ලංඝණයෙන් හෝ උල්ලංඝණය වීමට ආසන්නයෙන් මසක් ඉක්මවායාමට පෙර ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙත්සමක් ගොනු කළ යුතුය. තවද, සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය පනත හා කෲර වදහිංසාවට එරෙහි සම්මුතිය පනත උල්ලංඝණය කරනු ලබන අවස්ථාවක, ඒ සඳහා අදාල ක්‍රියාමාර්ග ගැනීමේ බලය මහාධිකරණය සතුය.

<u>අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ පනත</u>

2012 කාලාන්තරීය විශ්ව සමාලෝචන වාර්තාව, පරිච්ඡේද 128 සඳහන් නිර්දේශයන් - 2008 කාලාන්තරීය විශ්ව සමාලෝචන වාර්තාව පරිච්ඡේද 90 සඳහන් 'ස්වෙච්ඡා ප්‍රතිඥා'

19. ශ්‍රී ලංකාව 2015 මාර්තු මාසයේ දී 2015 අංක 4 දරණ අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ පනත නීතිගත කරන ලදී. මෙම පනත මගින් අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන්ගේ අයිතීන් ආරක්ෂා කිරීම අරමුණු කරගෙන ඇත. තවද, ඔවුන්ට වන්දි ලබාදීම සඳහා අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂණ අරමුදල ආරම්භ කිරීමද මේ මගින් සිදුවිය. එමෙන්ම පනත ක්‍රියාත්මක කිරීම තුලින් අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා ජාතික අධිකාරිය හා අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් සහායක සහ ආරක්ෂක පොලිස් කොට්ඨාශය පිහිටුවීමද සිදු විය. 2016 ජනවාරි 8 දින ගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් මෙම අධිකාරිය ආරම්භ කරන ලදී. 2016 වර්ෂයේ දී අධිකරණ අමාත්‍යාංශය විසින් රුපියල් මිලියන 2ක මුදලක් අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා ජාතික අධිකාරිය ස්ථාපනය හා පවත්වාගෙන යාම උදෙසා වෙන් කරන ලදී. අධිකාරියේ වැඩකටයුතු ආරම්භ කිරීම පිණිස 2017 වර්ෂයේ දී මෙම ප්‍රතිපාදනය තවත් වැඩි කෙරෙනු ඇත. අධිකාරියේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ක්‍රියාකාරී සැලසුමක් සකස් කරනු ලැබ ඇති අතර පොලිස්පතිවරයා විසින් සාක්ෂිකරුවන් ආරක්ෂාකිරීමේ කොට්ඨාශ ආරම්භ කිරීමට කටයුතු කරගෙන යනු ලැබේ.

<u>බලාත්මක කිරීමේ නව දේශීය නීති සැකසීම</u>

20. ශ්‍රී ලංකාව 2016 පෙබරවාරි 8 වැනි දින ආබාධිත පුද්ගලයන්ගේ අයිතීන් උදෙසා වන එක්සත් ජාතීන්ගේ සම්මුතිය අපරමානුගත කරන ලදී. තවද, බලෙන් අතුරුදහන් කරවූවන් සම්බන්ධ සම්මුතිය අත්සන් කිරීම 2015 දෙසැම්බර් 10 වැනි දින සිදුවිය. ඉන් අනතුරුව එම ගිවිසුම් බලාත්මක කිරීම පිණිස දේශීය නීති සම්පාදනයට අවශ්‍ය පියවර ගෙන ඇත. ආබාධිත පුද්ගලයන්ගේ අයිතින් සම්බන්ධයෙන් යෝජිත පනත් කෙටුම්පතෙන් නීතිය ක්‍රියාත්මක කිරීම නිරීක්ෂණයට අදාල අධිකාරියක් ස්ථාපිත කිරීමට ද යෝජනා වී ඇත. බලෙන් අතුරුදහන් කරවූවන්ට අදාල පනත් කෙටුම්පත් දැනට කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලදුව, පාර්ලිමේන්තුවේ විවාදය හා අනුමැතිය සඳහා යොමුකර ඇත.

## B. ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය

<u>ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම</u>

2012 කාලාන්තරීය විශ්ව සමාලෝචන වාර්තාවට අදාල නිර්දේශයන් පරිච්ඡේදය 127 – 30,31,32,33,34,36,37,38,39 සහ 40 පරිච්ඡේදය 128 – 14 හා 28, ස්වෙච්ඡා ප්‍රතිඥා (2008) 89 පරිච්ඡේදය.

21. 2015 මැයි 15 දින දරන 19 වැනි ව්‍යවස්ථා සංශෝධනයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමේ ස්වාධීනත්වය වඩාත් ශක්තිමත් කර ඇත. මෙම ව්‍යවස්ථා සංශෝධනය ප්‍රකාරව ස්වාධීන ආයතනයක් වන මෙහි මීට පෙර ජනාධිපතිවරයා සතුව පැවති අභිමතානුරූපිව සිදුකළ මැදිහත්වීම් හා නිලධාරින් පත්කිරීම් අහෝසි කරන ලදී. වර්තමානයේ සිදුවන සියලු පත්වීම් ව්‍යවස්ථා මණ්ඩලයේ (පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විවිධ පක්ෂ නියෝජනය කරමින් හා නිර්දේශපාලනික සාමාජිකයන්) නිර්දේශය මත සිදුකරයි. මානව හිමිකම් යාන්ත්‍රණය තුළ තම ස්වාධීනතාවය සඳහා උසස් පිළිගැනීමක් සහිත ආචාර්ය දීපිකා උඩුගම මහත්මිය, මානව හිමිකම් කොමිසමේ සභාපතිවරිය ලෙස 2015 ඔක්තෝබර් මස පත්වීම ලැබීය.

22. මානව හිමිකම් කොමිසම් සභාව සතු බලතල අතර මානව අයිතිවාසිකම් උල්ලංඝණයවීම හෝ උල්ලංඝණයවීමට ආසන්නව පැවතීම සම්බන්ධ පැමිණිලි බාරගැනීම, මැදිහත්වීම් හා සමථකිරීම මගින් ගැටළු විසඳීම, මානව හිමිකම් කඩකිරීම් සම්බන්ධ විමර්ශන කටයුතු, රඳවා තබාගෙන ඇති පුද්ගලයන්ගේ සුබ සාධක කටයුතු නිරීක්ෂණය කිරීම, ප්‍රධාන තැනක් ගනී. තවද, රජයට උපදෙස් හා සහය ලබාදීම, කොමිසම සතු වැදගත් බලතලයකි. මානව හිමිකම් ආරක්ෂණය සඳහා නීති සම්පාදනයේ දී හා පරිපාලන කටයුතු වලදී, ඒවා අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුකූලවන ලෙස සකස් කිරීමට නිර්දේශයන් ලබාදීම මානව හිමිකම් කොමිසම විසින් ඉටුකරයි.

<u>කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය</u>

23. කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය යටතේ කාන්තා අයිතිවාසිකම් සුරක්ෂිතකිරීම හා ප්‍රවර්ධනය පිළිබඳ වගකීම කාන්තා කටයුතු අමාත්‍යාංශය සතුය. තවද, කාන්තා සංවර්ධන නිලධාරීන්, කාන්තා හා ළමා කටයුතු වෙනුවෙන් පොලිස් ස්ථානයන්හි පිහිටුවා ඇති කාන්තා හා ළමා සහාය අංශ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල පිහිටුවා ඇති කාන්තා හා ළමා කටයුතු ඒකක මගින් කාන්තාවන් නගා සිටුවීම, කාන්තා අයිතීන් ආරක්ෂාවට හා ප්‍රවර්ධනයට අදාල වැදගත් කාර්යයන් රාශියක් ඉටුකිරීමේ වගකීම අමාත්‍යාංශය සතුය.

24. ළමා අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය යටතේ ඇති ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ මූලික වගකීම ද පැවරී ඇත්තේ කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය යටතේය. මේ සඳහා පිහිටුවා ඇති ව්‍යවස්ථාපිත ආයතන හා දෙපාර්තමේන්තු ලෙස ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව දැක්විය හැකිය. තවද, ළමා ආරක්ෂණය හා සුබ සාධනය සම්බන්ධයෙන් අමාත්‍යාංශ ගණනාවක් කටයුතු කරයි. ඒ අතර ප්‍රධාන ස්ථානයක් සමාජ බලගැන්වීම් හා සුබ සාධන, අධිකරණ, අධ්‍යාපන හා සෞඛ්‍යය යන අමාත්‍යාංශයන්ට ලැබී ඇත. පළාත් මට්ටමින්, පළාත් කොමසාරිස්වරයෙක් යටතේ පරිවාස ආයතන 09ක් ක්‍රියාත්මක වේ. මධ්‍යම පරිවාස භාර අරමුදල මගින් අවශ්‍යය අරමුදල් සැපයීම සිදුවේ. දිස්ත්‍රික්ක මට්ටමින් ළමා සංවර්ධන කමිටු පිහිටුවමින්, දරුවා සංවර්ධනය සඳහා අදාල දිස්ත්‍රික්කය තුළ ගනු ලබන සියලු පියවර නිරීක්ෂණය කරනු ලබයි. මෙම කමිටු විවිධ අංශයන් නියෝජනය කරමින් විශේෂිත රාජ්‍ය නිලධාරීන්, රාජ්‍ය නොවන සංවිධානවල නියෝජිතයන් හා ළමා කටයුතුවලට සම්බන්ධ ආගමික නායකයන් සම්බන්ධවේ.

<u>රාජ්‍ය භාෂා කොමිසම</u>

25. 1991 වර්ෂයේ ස්ථාපිත රාජ්‍ය භාෂා කොමිසම සතුව විශාල පරිමාණ බලතල රාශියක් පවතී. ව්‍යවස්ථාවේ සඳහන් භාෂාව සඳහා වූ වගන්ති සලකා බැලීම මූලික වශයෙන් සිදුකරන මෙම කොමිසමේ බලතල රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය සකස් කිරීමේ නිර්දේශයන් ලබාදීම, රාජ්‍ය භාෂා භාවිතය ප්‍රවර්ධනය හා භාෂණයේ අයිතිය උල්ලංඝණය වූ විට එයට අදාල පැමිණිලි විභාග කිරීම තෙක් පැතිර පවතී.

__රාජ්‍ය නොවන සංවිධාන අධීක්ෂණය__

2012 චක්‍රයේ නිර්දේශයන් පරිඡේදය128-85

26. ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ පිහිටුවා ඇති රාජ්‍ය නොවන සංවිධාන සඳහා වූ ලේකම් කාර්යාලය, රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ විෂය පථයෙන් ඉවත්කර සිවිල් අධිකාරියකට ලබා දී තිබේ.

**C. මානව හිමිකම් පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම**

2012 චක්‍රයේ නිර්දේශයන්, පරිච්ඡේදය 127 – 5,6,7,10,11,12,13,14,15, 16,17,18, 19,20, 24,29,41 හා 2008 චක්‍රයේ ස්වේච්ඡා ප්‍රතිඥා, පරිච්ඡේදය 4.2

27. එවකට පැවති ආපදා කළමණාකරන හා මානව හිමිකම් අමාත්‍යාංශය මගින් සකස්කළ 2011 සිට 2016 සඳහාවූ මානව හිමිකම් ආරක්ෂාකිරීමේ හා ප්‍රවර්ධනය කිරීම සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම 2011 මැයි මස කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලදී. එම සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා කැබිනට් අනුකමිටුවක් පත් වුවද, ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේ දී සැලකිය යුතු බාධක රැසකට මුහුණ පෑමට පසුගිය රජයට සිදුවිය. විශේෂයෙන් අවශ්‍ය සම්පත් වෙන් කිරීම, ස්ථිර කේන්ද්‍රිය ආයතනයක් නොමැතිවීම දැකිවිය හැකිය. තත්ත්වය මෙසේ තිබියදී, සැලැස්ම පිළිබඳ දැනුවත් කිරීම හා ක්‍රියාත්මක කිරීම අත්හැර දැමීමට පසුගිය රජය පියවර ගන්නා ලදී.

28. කෙසේ වෙතත් 2015 වර්ෂයේ සිදු වූ ආණ්ඩු වෙනස්වීමෙන් අනතුරුව නව රජය පැරණි සැලැස්මේ පහත සඳහන් ක්‍රියාකාරී අංග හඳුනාගනිමින්, ඒවා වර්තමාන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියට ඇතුලත් කරන ලදී.

(අ) 1979 ත්‍රස්තවාදය පිටු දැකීමේ පනත සමාලෝචනය කර අන්තර්ජාතික ප්‍රමිතීන් වලට සුදුසුවන පරිදි සංශෝධනය කිරීම.

(ආ) අපරාධ නඩු විධාන සංග්‍රහය සංශෝධනය කරමින්, අත් අඩංගුවට ගැනීමක් සිදුකළ සෑම විටම එය පවුලේ සාමාජිකයන් වෙත දැනුම් දීමත්, මහේස්ත්‍රාත්වරයාට රැඳවීමේ මධ්‍යස්ථාන නිරීක්ෂණය කිරීමටත්, කඩිනම් නීතිඥ සහය ලබාගැනීම තහවුරු කිරීමටත් අවස්ථාව ලබාදීම.

(ඇ) බලෙන් අතුරුදහන් කරවීම අපරාධ වරදක් ලෙස නීතිගත කිරීම.

(ඈ) අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ පනත සම්පූර්ණයෙන් නීතිගතකර බලාත්මක කිරීම.

(ඉ) තොරතුරු දැන ගැනීමේ පනතක් ගෙන ඒම.

(ඊ) අධිකරණ පරිපාලනයේ ඇතිවන ප්‍රමාද අවම කිරීමට අවශ්‍ය නීති සම්පාදනය කිරීම.

(උ) ලිංගික වධහිංසා පැමිණවීමට එරෙහි ප්‍රතිපත්ති සමාලෝචනය, සම්පාදනය හා රාජ්‍ය අංශයේ එම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.

29. පැරණි සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ දී උගත් වැදගත් පාඩම් වත්මන් 2017 – 2021 සැලැස්ම සකස් කිරීමේදී, ප්‍රචාරණයේදී හා ක්‍රියාත්මක කිරීමේදී සැලකිල්ලට ගන්නා ලදී.

30. ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්මට කැබිනට් මණ්ඩලයේ අනුමැතිය හිමිවී ඇති අතර, වර්තමානයේ එය සිංහල හා දෙමළ භාෂාවන්ට පරිවර්තනය වෙමින් පවතී. මෙම සැලැස්ම උචිත, ප්‍රමාණවත්, ළඟා කරගත හැකි සාධක සහිතව තේමාත්මක පරිච්ඡේද 10ක් යටතේ මානව හිමිකම් ප්‍රවර්ධනය හා ආරක්ෂාව හා සම්බන්ධව සකස් කර ඇත. විදේශ කටයුතු අමාත්‍යාංශය ප්‍රධාන

කොටගත් අන්තර් අමාත්‍ය අනුකමිටුවක් හරහා ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම සිදුකරනු ලබයි.

<u>මානව හිමිකම් පිළිබඳ අධ්‍යාපනය</u>

**අංක 127 හි සඳහන් නිර්දේශ (2012) – 35, 80,81, 86 සහ 87; සහ පරිච්ඡේද අංක 91, 92 සහ 112 (2008) පරිච්ඡේද සඳහන් ස්වේච්ඡා පතිඥා 3**

31. අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ද්විතීක අධ්‍යාපන විෂය නිර්දේශය සඳහා මානව හිමිකම් විෂය ඇතුළත් කර ඇත. එයට අමතරව නීතිය ක්‍රියාත්මක කිරීමේ කාර්යයෙහි නිරත නිලධාරීන්, ත්‍රිවිධ හමුදා සාමාජිකයන් හා බන්ධනාගාර නිලධාරීන්ට ලබාදෙන පුහුණුව තුළ ද මානව හිමිකම් අධ්‍යාපනය අන්තර්ගතය. අදාළ පුහුණුව සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් තහවුරු කර ඇති මූලික අයිතිවාසිකම්, ජාත්‍යන්තර මානව හිමිකම්, අපරාධ නීති ක්‍රියා පිළිවෙල, පුරවැසියාගේ අයිතිවාසිකම්, නීතිය ක්‍රියාත්මක කිරීමේ නිරත නිලධාරීන්ගේ රාජකාරි හා වගකීම් යන විෂය කරුණු අන්තර්ගතය.

32. ශ්‍රී ලංකා යුධ හමුදාව, මානව හිමිකම් හා මානුෂීය නීතිය පිළිබඳ අධ්‍යක්ෂවරයකු යටතේ වූ අංශයකින් සමන්විත වන අතර සියලුම හමුදා සාමාජිකයන් සඳහා මානව හිමිකම් හා අන්තර්ජාතික මානුෂීය නීතිය පිළිබඳ පුහුණුව ලබාදීම එම අංශයේ අරමුණයි. තවද අන්තර්ජාතික රතු කුරුස සමාජය හමුදා සාමාජිකයන් සඳහා මානුෂීය නීතිය සම්බන්ධයෙන් ක්‍රමවත් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරයි. පොලිස් දෙපාර්තමේන්තුවේ පුහුණු පාසලේ නව නිලධාරීන්ට ලබාදෙන මූලික පුහුණුව තුළින් ද, ප්‍රවර්ධන හා නවමු පාඨමාලා පිරිනමමින් උසස් පොලිස් පුහුණු ආයතනය විසින් මෙහෙයවන විභාග තුළින් ද මානව හිමිකම් අධ්‍යාපනය ආවරණය වේ.

33. මානව හිමිකම් පිළිබඳව මහජනතාවගේ දැනුවත්භාවය ඉහළ නැංවීම වෙනුවෙන් ද පියවර ගෙන තිබේ. උදාහරණයක් ලෙස මානව හිමිකම් ප්‍රවර්ධනය හා ආරක්ෂා කිරීමෙහි ලා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව හා පොදු රාජ්‍ය මණ්ඩල පාර්ලිමේන්තු සංගමය 2016 පෙබරවාරි මස පැවැත්වූ පොදු රාජ්‍ය මණ්ඩල කලාපීය සම්මන්ත්‍රණය පිළිබඳව සඳහන් කළ හැක. මේ සඳහා ශ්‍රී ලංකාව ඇතුලුව බංග්ලාදේශය, ඉන්දියාව, පකිස්ථානය සහ මාලදිවයින යන ආසියානු කලාපයට අයත් රටවල පාර්ලිමේන්තු නියෝජිතයන්, අමාත්‍යවරුන් හා මානව හිමිකම් විශේෂඥයින් එම සම්මන්ත්‍රණය සඳහා සහභාගී වූහ.

## IV. නිර්දේශ සහ ස්වේච්ඡා ප්‍රතිඥා ක්‍රියාත්මක කිරීම

A. ක්ෂේත්‍ර කීපයක් හා එකවිට සම්බන්ධ කාරණා

<u>සමානාත්මතාව සහ වෙනස්කම් පිටුදැකීම</u>

128 ඡේදයෙහි (2012) – 53 සඳහන් නිර්දේශ

34. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන වගන්තියෙන් සමානාත්මතාවය හා සර්ව සාධාරණත්වයේ අයිතිය තහවුරු කර ඇත.ව්‍යවස්ථාවේ 12 (1) වගන්තිය යටතේ සහතික කර ඇති නීතියේ සමානාත්මතාවයේ හා සර්ව සාධාරණත්වයේ අයිතියට කිසිදු ව්‍යතිරේඛයක් කළ නොහැක. එපමණක් නොව, ව්‍යවස්ථාවේ 12 (2) වගන්තියේ ප්‍රකාශිත වෙනස්ව සැලකීම තහනම් කෙරෙන හේතුන්ට අමතරව තවත් හේතුන් තිබිය හැක.

35. මූලික අයිතිවාසිකම් පිළිබඳ පාර්ලිමේන්තු අනුකමිටුවේ අවසන් වාර්තාව නිර්දේශ කරන්නේ ලිංගික දිශානතිය, ලිංගික අනන්‍යතාව හා ආබාධිත පුද්ගලයන් යනාදී කරුණු සම්බන්ධව නොවෙනස්ව සැලකුම් ලැබීමේ අයිතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලිඛිතව සහතික කළ යුතු බවයි.

36. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 16(1) වගන්තියට අනුව ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පිළිබඳ පරිච්ඡේදය නොතකා 'පවත්නා ලිඛිත නීති සහ ලිඛිත නොවූ නීති බලාත්මකව ක්‍රියාත්මක වන්නේය.' එහෙත් මෙම වගන්තිය දණ්ඩ නීති සංග්‍රහය හෝ වෙනත් අපරාධ නීති ප්‍රතිපාදන යම්කිසි පුද්ගලයකුට හෝ ප්‍රජාවකට එරෙහිව අසමානව හෝ වෙනස්කමින් යුතුව යොදා ගැනීමට අවසර

නොදෙන බව ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ ආර්ථික, සමාජ හා සංස්කෘතික කමිටුව ඉදිරියේ පැහැදිලි කර ඇත. මේ අතර නීති පැනවීමෙන් පසුව ඒවා අධිකරණ සමාලෝචනයට ලක්කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 80 (3) වගන්තිය යටතේ වළක්වා තිබේ.

37. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ වූ මෙම විශේෂිත ප්‍රතිපාදන දැනට ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ යටතේ සලකා බැලෙමින් පවතී. ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සඳහා වූ මහජන අදහස් පිළිබඳ කමිටුව මෙන්ම මූලික අයිතිවාසිකම් පිළිබඳ පාර්ලිමේන්තු අනු කමිටුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 16(1) වගන්තිය සංශෝධනය කිරීමද, නීති පැනවීමෙන් පසු ඒවා අධිකරණ සමාලෝචනයට ලක්කිරීමද නිර්දේශ කර ඇත. මෙම නිර්දේශ දැනට ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සඳහා වූ පාර්ලිමේන්තු කමිටුව මගින් සලකා බලනු ලැබේ.

<u>සංහිඳියාව හා වගවීමේ ක්‍රියාවලිය</u>

127 ඡේදයෙහි (2012) නිර්දේශයන් - 8,9,21,22,23, 25,26,27,28, 42, 45, 46, 52, 59, 75, 76,77, 78, 82, 85, 89

38. 'ශ්‍රී ලංකාවේ සංහිඳියාව, වගවීමේ ක්‍රියාවලිය සහ මානව හිමිකම් ප්‍රවර්ධනය' පිළිබඳ 30/1 සහ 34/1 දරණ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිල අභියෝජනා සඳහා ශ්‍රී ලංකා රජය පිළිවෙලින් 2015 සැප්තැම්බර් මාසයේදී සහ 2017 මාර්තු මාසයේදී සම අනුග්‍රහය දක්වන ලදී. මෙම අභියෝජනා හරහා සංහිඳියාව ප්‍රවර්ධනයට, ජාත්‍යන්තර මානුෂීය නීතියට අනුව චෝදනා ලද මානව හිමිකම් උල්ලංඝණය වීම් පිළිබඳව වගවීමේ ක්‍රියාවලිය සහතික කිරීමටත්, රටේ මානව හිමිකම් පිළිබද තත්ත්වයේ වර්ධනයක් අත්පත් කරගන්නටත් යනාදී වශයෙන් පුළුල් කැපවීමක් පෙන්නුම් කිරීමට හැකි විය. උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ හිතකර නිර්දේශයන් ඉහත සඳහන් යෝජනාවන්හි යම් කොටසක් නිර්මාණය කිරීමට ඉවහල් විය. එසේම උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, වසර 2017-2021 සඳහා වන මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්ම සැකසීමෙහිලා පාදක වූ ප්‍රධාන ලියවිල්ලක් විය. මානව හිමිකම් කවුන්සිල යෝජනාව වෙනුවෙන් වූ කැපවීම මුදුන් පමුණුවා ගනිමින්, රජය උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ නිර්දේශයන් ද, 2017-2021 සඳහා වන මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්මේ අංගද ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ. විශේෂයෙන් අදාළ යෝජනා හරහා සිදුකිරීමට බලාපොරොත්තුවන්නේ අතුරුදන්වූ පුද්ගලයන් සෙවීමේ කාර්යාලයක් පිහිටුවීම, සත්‍ය සෙවීමේ කොමිෂන් සභාවක් පිහිටුවීම, හානිපූර්ණය වෙනුවෙන් කාර්යාලයක් පිහිටුවීම සහ ස්වාධීන නීතිඥයන්ගෙන් සමන්විත විශේෂ අධිකරණයක් ස්ථාපිත කිරීම යන අංගවලින් සමන්විත සංක්‍රාන්ති අධිකරණ යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීමයි.

39. රටේ සමගිය හා සංහිඳියාව උදා කර ගැනීම වෙනුවෙන් රජය විසින් නව ආයතන තුනක් එනම්, ගරු ජනාධිපතිතුමාම අමාත්‍යවරයා වශයෙන් කටයුතු කරන ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන අමාත්‍යාංශය, ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය හා ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන අමාත්‍යාංශය යටතේ වන ආයතනයක් ලෙස ජාතික සමගිය හා සංහිඳියාව පිළිබඳ කාර්යාලය ස්ථාපනය කරන ලද්දේය. වසරක කාලයක් තිස්සේ මේ කරුණ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන විවිධ පාර්ශ්ව හා සමග උපදේශනවල නිරත වෙමින් ද උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන වාර්තාව සහ මීට පෙර සංහිඳියාව සම්බන්ධයෙන් ජාතික වශයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග ඔස්සේ ජාතික සමගිය හා සංහිඳියා කාර්යාලය සංහිඳියාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් කෙටුම්පත් කර ඇත. අදාළ ප්‍රතිපත්තිය රටේ සංහිඳියා ක්‍රියාපිළිවෙලට මග පෙන්වන අතර, ජාතික සංහිඳියාව ඇතිකිරීමෙහි ලා, ඒ කෙරෙහි උනන්දුවක් දක්වන සියලු පාර්ශ්ව, ඒකාකාර හා පැහැදිලි ප්‍රවේශයකට මෙහෙයවනු ලබයි. ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන අමාත්‍යවරයා වශයෙන් ගරු ජනාධිපතිතුමා හා ගරු ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශයක් අනුව අදාළ ප්‍රතිපත්තිය සම්මත කරගැනීම සඳහා 2017 මැයි මාසයේ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය හිමි විය. මේ අතරවාරයේ පරිපූර්ණ ශ්‍රී ලංකාවක් යන දැක්ම ඉදිරියට ගෙනයාම සඳහා ජාතික සමගිය හා සංහිඳියා කාර්යාලය රාජ්‍ය හා පෞද්ගලික මාධ්‍ය, සමාජ ජාල හා එක්ව දීප ව්‍යාප්ත වැඩපිළිවෙලක් ආරම්භ කර තිබේ.

40. 2015 දෙසැම්බර් මාසයේදී රජය විසින් සංහිඳියා යාන්ත්‍රණ සම්බන්ධීකරණ ලේකම් කාර්යාලයක් අග්‍රාමාත්‍ය කාර්යාලය යටතේ ස්ථාපනය කරනු ලැබුවේ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ 30/1 දරණ යෝජනාව ඉටුකරගැනීමේ අභිලාශයෙනි. සංහිඳියා යාන්ත්‍රණ සම්බන්ධීකරණ ලේකම් කාර්යාලයට පැවරී ඇත්තේ රජයේ සංක්‍රාන්ති අධිකරණ යාන්ත්‍රණය සකස් කිරීම සහ ඊට පහසුකම් සැලසීම මෙන්ම ජාතික සමගිය හා සංහිඳියා කාර්යාලයේ කාර්යභාර්ය සම්බන්ධයෙන් පහසුකම් සැලසීම හා නැවත සිදුනොවීමේ න්‍යාය පත්‍රය සාක්ෂාත් කරගැනීම වෙනුවෙන් සහාය දීමයි.

41. සංහිඳියා යාන්ත්‍රණ සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය ස්ථාපනය කිරීමත් සමගම සංහිඳියා යාන්ත්‍රණය නිර්මාණය කිරීමෙහි ලා ජාත්‍යන්තර මට්ටමින් අනුගමනය කර ඇති හොඳම ක්‍රමවේදයන් අනුගමනය කර ඇත්දැයි සහතික කරගැනීම සඳහා එය එක්සත් ජාතීන්ගේ මෙරට කාර්යාලය හා සහයෝගීතාවයෙන් කටයුතු කර ඇත. මීට අමතරව එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමසාරිස් කාර්යාලය, එක්සත් ජාතීන්ගේ දේශපාලන කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව, සංක්‍රමණිකයන් පිලිබඳ ජාත්‍යන්තර සංවිධානය, එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල හා එක්සත් ජාතීන්ගේ කාන්තාවෝ වැනි සංවිධාන සමගද සහයෝගිතාවෙන් කටයුතු කර ඇත. රජයේ සංහිඳියා න්‍යාය පත්‍රයේ ක්‍රියාත්මක විය හැකි කොටස්වලට සහයෝගය දැක්වීම සඳහා සාමය ගොඩනැගීමේ ප්‍රමුඛතා සැලැස්මක් සකස් කරන ලදී. සංහිඳියා යාන්ත්‍රණ සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය මේ වන විට එක්සත් ජාතීන් හා සමග සැලැස්මේ අධීක්ෂණය කළ යුතු සහ ඇගයිය යුතු කොටස් පිළිබඳව අවසන් අදියරට ලඟාවෙමින් තිබෙන අතර, ඊට අමතරව මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන රජයේ ප්‍රධාන පාර්ශ්ව සහ එක්සත් ජාතීන්ගේ ආයතන සමග සමීපව කටයුතු කරමින් වර්ධනය කරගත් සංකල්පීය කරුණු පිළිබඳව ද අවසන් අදියරට ලඟාවෙමින් සිටී.

42. ශ්‍රී ලංකාව තුළ සංහිඳියාව සහ පෙර ක්‍රියා යළි සිදුවීම වැළැක්වීම හා සම්බන්ධ සියලු ක්‍රියාකාරකම් වෙත සැම අන්තයකින්ම අවධානය යොමු කිරීම සඳහා සංහිඳියාව පිළිබඳව ඉහළ මට්ටමේ කමිටුවක් ස්ථාපනය කරන ලදී. ජාතික සමගිය හා සංහිඳියා කාර්යයාලයේ සභාපති, හිටපු ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මිය මෙම කමිටුවේ මූලසුන හොබවන අතර, සංහිඳියා යාන්ත්‍රණ සම්බන්ධීකරණ ලේකම් කාර්යාලයේ මහලේකම්වරයා කමිටුවේ කැඳවුම්කරු ලෙස කටයුතු කරයි.

43. සංහිඳියාව හා සංක්‍රාන්ති අධිකරණ යාන්ත්‍රණය සම්බන්ධ ක්‍රියාවලිය හා පිළිබඳව රජය විසින් 2016 ජනවාරි මාසයේ උපදේශන කාර්යය බලකායක් පත් කරන ලදී. මේ කාර්ය බලකාය සිවිල් සමාජයේ පිළිගත් නියෝජිතයන්ගෙන් සමන්විත වූ අතර ඊට විශේෂඥ කමිටුවක සහාය හිමිවෙද්දී, කාර්ය බලකාය අදාළ විෂය සම්බන්ධව උනන්දුවක් දක්වන පාර්ශ්ව හා සම්බන්ධ කරනු ලැබුවේ නියෝජිත කමිටුව විසිනි. උපදේශන කාර්යය බලකාය රටපුරා උපදේශන ක්‍රියාත්මක කළ අතර එහි ප්‍රතිඵලයක් ලෙස අදහස් 7000 කට වැඩි සංඛ්‍යාවක් ඉදිරිපත් කෙරිණ.එහි අවසන් වාර්තාව 2017 ජනවාරි මාසයේ රජයට ඉදිරිපත් කෙරුනු අතර, එහි නිර්දේශ සංක්‍රාන්ති අධිකරණ යාන්ත්‍රණය පිහිටුවීමට අවශ්‍ය නීති සම්පාදනය කිරීම සඳහා උපයෝගී කර ගැනීමට අදහස් කෙරේ.

44. මානව හිමිකම් කවුන්සල අභියෝජනා 30/1 සහ 34/1 යටතේ කෙරෙන ලද නිර්දේශ අනුව සංක්‍රාන්ති අධිකරණ යාන්ත්‍රණයේ අංග හතරක් ස්ථාපනය කිරීමට රජය පියවර ගෙන ඇත. පළමුව 2016 අගෝස්තු මාසයේ දී අතුරුදන්වූවන් පිළිබඳ සොයා බැලෙන කාර්යාලයක් පිහිටුවීම සඳහා නීති සම්පාදනය කෙරිණ. එහෙත් බලාපොරොත්තු නොවූ පරිදි මෙම පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ දින පැවති විවාදයේ දී ඇතිවූ කඩාකප්පල්කාරී ක්‍රියා හේතුවෙන් කැබිනට් මණ්ඩලයේදී කෙටුම්පත සඳහා ඉදිරිපත් වූ යම් සංශෝධන සඳහා ඉඩ ලබාදිය නොහැකි වීමයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස අතුරුදන්වූවන් පිළිබඳ සොයා බැලෙන කාර්යාලය ක්‍රියාත්මක කිරීමට පෙර, පනත සංශෝධනය කිරීමට අදාළ කෙටුම්පතක් පාර්ලිමේන්තුවට යොමුකර ඇත. දෙවනුව, සත්‍ය සෙවීමේ යාන්ත්‍රණයක් කෙටුම්පත් කිරීම සඳහා නීති සම්පාදනයට ජ්‍යෙෂ්ඨ විද්‍යාර්ථීන්, රජයේ බලධාරීන් සහ සංක්‍රාන්ති අධිකරණ කටයුතු සම්බන්ධ විශේෂඥයින්ගෙන් සමන්විත ක්‍රියාකාරී කණ්ඩායමක් පත්කරන ලදී. කෙටුම්පත් කිරීමේ කාර්යභාරයේදී උපදේශන කාර්යය බලකායේ නිර්දේශ දැඩි සැලකිල්ලට ගනු ලැබීය. තෙවනුව, හානිපූරණය පිළිබඳ කාර්යාලයක් පිහිටුවීම සඳහා අවශ්‍ය කෙටුම්පතකට නීති

සම්පාදනය කිරීම සඳහා හානිපූරණ තාක්ෂණ කමිටුවක් පත් කරන ලදී. කාර්ය බලකා වාර්තාව, රාජ්‍ය අමාත්‍යාංශ කිහිපයක අදහස් සහ හානිපූරණය සම්බන්ධව මහජන නිලධාරීන් සතුවූ අත්දැකීම්, කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලියේදී සැලකිල්ලට ගැනිණ. සත්‍ය සෙවීමේ යාන්ත්‍රණය සහ හානිපූරණය පිළිබඳ කාර්යාලයට අදාළ නීති කෙටුම්පත් කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කෙරෙන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලදැයි නීතිපතිවරයා විසින් මැනවින් අධීක්ෂණය කිරීමෙන් පසුවයි. තවද විශේෂ අධිකරණයක් ස්ථාපනය කිරීමට අදාළව නීති කෙටුම්පත් කිරීමේ කාර්යය ඉතා ඉක්මණින් ආරම්භවීමට නියමිතයි.

45. ඉඩම්, අධ්‍යාපනය, ජීවනෝපාය, භාෂාව, මනෝ - සමාජයීය ආධාර යන ක්ෂේත්‍රයන් හි කෙටි හා මධ්‍යකාලීනව විශ්වාසය ගොඩනැගීමේ වැඩ පිළිවෙළක් ඔස්සේ සංහිඳියාව ප්‍රවර්ධනය කිරීමට රජය අපේක්ෂා කරයි. මේ අතුරින් ක්‍රියාමාර්ග රැසක් ඇත්ත වශයෙන්ම නිර්දේශ කර ඇත්තේ උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම විසිනි.

46. හමුදාව අත්පත් කරගෙන ඇති පුද්ගලික ඉඩම් නිදහස් කිරීම රජයේ තවත් ප්‍රධාන ප්‍රමුඛතාවයකි. වසර 2009 ගැටුම් අවසන්වීමෙන් පසු මෙතෙක් අක්කර 24,336.25 ක පුද්ගලික ඉඩම් නිදහස් කර ඇත. මින් අක්කර 4190.58 ක්ම නිදහස් කර ඇත්තේ 2015 ජනවාරි වලින් පසුවය.අක්කර 6051.36 වන පුද්ගලික ඉඩම් ප්‍රමාණයක් තවමත් නිදහස් කිරීමට ඉතිරිව තිබේ.

47. ගැටුම් උග්‍රව පැවති උතුරු හා නැගෙනහිර පළාත්වල පැවති පාසල් 2009 දී යුද්ධයේ නිමාවෙන් පසුව නැවත විවෘත කරන ඇත. එල්.ටී.ටී.ඊ සංවිධානයේ ළමා සොල්දාදුවන්ව සිටියවුන් - ඇතුළුව එම පළාත්වල ළමුන් නැවත පාසල් යාම ආරම්භ කර ඇත. 2009න් පසු කාන්තා ළමා සොල්දාදුවන් රැසක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවූ අ.පො.ස සාමාන්‍ය පෙළ හා උසස් පෙළ විභාගයන්ට පෙනී සිට ඇත.

48. උතුරු හා නැගෙනහිර පළාත්වල කාන්තාවන් ගෘහ මූලිකත්වය දරණ පවුල් ප්‍රතිශතය 23.4% කි. 2015 දී රජය විසින් කාන්තා ගෘහ මූලික ජාතික කමිටුවක් හා කාන්තාවන් ගෘහ මූලිකත්වය දරණ පවුල් සඳහා වූ ජාතික ආයතනය කිලිනොච්චියේ පිහිටුවන ලදී. මෙම කමිටු මගින් කාන්තාවන් ගෘහ මූලිකත්වය දරණ පවුල් ශ්‍රම බලකායට එක් කිරීමටත්, සාර්ථක ජීවනෝපාය මාර්ගයක් ලබාදීමටත් මැදිහත් වී කටයුතු කරයි.

49. 2015 පත්වූ නව රජය ජාතික ගීය රාජ්‍ය භාෂා දෙකෙන්ම (සිංහල හා දෙමළ ) ගායනා කිරීම හඳුන්වා දෙන ලදී. ඒ අනුව 2015, 2016,2017 වර්ෂවල ජාතික නිදහස් දින සැමරුම් උත්සවයන් හීදී ජාතික ගීය භාෂා ද්විත්වයෙන්ම ගායනා කරන ලදී.

50. යුද්ධයෙන් පීඩාවට පත්වූ ජන කොටස් හි මනෝ සමාජීය තත්ත්වයන් වර්ධනය කිරීමේ රාමුවක් සකස් කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සකස් කර ඇත. නිදසුනක් ලෙස ජාතික සමගිය හා සංහිඳියා කාර්යාලය මනෝ විද්‍යා උපදේශකවරුන් හා මනෝ විද්‍යාඥයින් රැසක් සම්බන්ධ කරගනිමින් උතුරු පළාතේදී පුහුණුකරුවන්ට පුහුණුවක් ලබාදෙන ලදී. මෙහි අරමුණ වූයේ දහසකට වැඩි සංවර්ධන නිලධාරීන් පුහුණු කරමින් දැඩි මානසික ව්‍යාකූලතාවයන්ට පත්වූ පුද්ගලයන්ට එම ප්‍රජාව තුළදීම සහාය ලබා දීමයි.

**B.** සිවිල් හා දේශපාලන අයිතීන්

<u>ජීවත්වීමේ අයිතිය, නිදහස හා පුද්ගල ආරක්ෂාව</u>

2012 වාර්තාව 127 පරිච්ඡේදයේ සඳහන් නිර්දේශ 54, 74, 79,83, 84, 100, 2013 ස්වේච්ඡා ප්‍රතිඥා පරිච්ඡේද 4.9

51. 2017 – 2021 සඳහා වන ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලසුමෙහි ජීවත්වීමේ නිදහස ව්‍යවස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය පැහැදිලිවම දක්වා ඇත. මූලික අයිතිවාසිකම් සඳහා පාර්ලිමේන්තු අනුකමිටුව

විසින් ද මෙම යෝජනාවම ඉදිරිපත් කිරීම නිසා, ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියෙන් අනතුරුව ජීවත්වීමේ අයිතිය ව්‍යවස්ථාපිත වන බවට විශ්වාස කළ හැක.

52. රජය විසින් පසුගිය වකවානුව තුළ සිදුවූ මිනීමැරුම් පිළිබඳ විමර්ශන ආරම්භ කරන ලදී. නිදසුනක් ලෙස 2006 වසරේදී සිදුවූ ත්‍රිකුණාමලයේ තරුණයන් 05 දෙනාගේ ඝාතන නඩුව එම මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වෙමින් පවතී. (නඩු අංක 4634/ PC / 2013) සියලු සාක්ෂිකරුවන් කැඳවා ඔවුන්ගේ ප්‍රකාශ සටහන් කිරීම අවසාන කර ඇති අතර විදේශගතව සිටින සාක්ෂිකරුවන් කැඳවීමට සිතාසි යවා ඇත. ජිනීවා හි සිටින ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ නිත්‍ය නියෝජිතවරයා මගින් ගුවන්තොටුපොළක සිට තවත් ගුවන්තොටුපොළකට ඇතුලුව අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ පනත යටතේ ඔවුන්ට අවශ්‍ය උපරිම ආරක්ෂාව සැලසීමට කටයුතු කරන බව දැනුම් දෙන ලදී. තවද ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයෙන් සාක්ෂි ලබාදීම පහසුකිරීම උදෙසා මෙම පනතේ අංක 31 දරණ වගන්තිය සංශෝධනය කිරීමට කැබිනට් අනුමැතිය ලැබී ඇත. එසේම, වසර 2013දී රතුපස්වලදී පැවති මහජන විරෝධතාවයකදී විරෝධතාකරුවන්ට වෙඩි තැබීමට අණ දුන් බවට සැක කරන හමුදා නිලධාරියෙක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2017 මැයි මාසයේදී අත් අඩංගුවට ගනු ලැබීය.

53. 1976 සිට මේ දක්වා ශ්‍රී ලංකාව මරණ දඬුවම ක්‍රියාත්මක කර නැත. තවද ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ මහාමණ්ඩලය විසින් කලින් කලට සම්මත කරගන්නා මරණ දඬුවම විලම්බනය කිරීම පිළිබඳ අභියෝජනාවට පක්ෂව ඡන්දය පළ කර ඇත.

54. පුද්ගලයන්ගේ ජීවත්වීමේ අයිතිය, නිදහස, හා ආරක්ෂාවට ගරු කිරීමට, ආරක්ෂා කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමට අදාලව රජය විසින් විවිධ ක්ෂේත්‍ර ඔස්සේ පියවර කිහිපයක් ගෙන තිබේ. එම ක්ෂේත්‍ර අතුරින් කිහිපයක් ලෙස බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, අත්අඩංගුවට ගැනීමේදී නීතිඥ සහාය ලබා ගැනීම හා ත්‍රස්තවාදය මර්ධනය සඳහන් කළ හැක.

55. නව බන්ධනාගාර පරිපාලන පනත් කෙටුම්පත, බන්ධනාගාර පද්ධතියේ කාර්යක්ෂමතාව වර්ධනය හා බන්ධනාගාරවල පවතින තදබදය වැනි ගැටලුවලට පිළියම් අරමුණු කරගනිමින් අවසන් අදියරට පැමිණ ඇත. මෙම කෙටුම්පත කැබිනට් මණ්ඩලයට යොමුකිරීමෙන් අනතුරුව එම අදහස් සංශෝධනයට ලක් කරමින් පවතී. නගරබද බන්ධනාගාර වෙනත් ස්ථානවලට රැගෙන යාමේ වැඩපිළිවෙල හඳුන්වාදෙන ලද්දේ බන්ධනාගාරවල ඉඩ පහසුකම් නොමැතිවීමේ ගැටලුවට පිළියමක් වශයෙනි.

56. එක්සත් ජාතීන්ගේ නෙල්සන් මැන්ඩෙලා නීති සමුදාය සහ බැංකොක් නීති වලට ප්‍රමුඛත්වය ලබාදීමට බන්ධනාගාර දෙපාර්තමේන්තුව පියවර රැසක් ගෙන තිබේ. වැලිකඩ බන්ධනාගාරයේ රැඳවියන්ට තම පවුල්වල සාමාජිකයන් සමග දුරකතනයෙන් සම්බන්ධවීමේ අවස්ථාව ලබාදී ඇත. මෙම පහසුකම කෙටි කලකින් අනෙකුත් බන්ධනාගාරවලට ලබාදීම අරමුණයි. තවද බන්ධනාගාර තොරතුරු කළමනාකරණ ක්‍රියාවලියක් හඳුන්වාදීම මගින් රැඳවියන් සම්බන්ධ වාර්තා සාර්ථකව හා කාර්යයක්ෂමව පවත්වාගෙන යාමට හැකියාව ලැබී ඇත.

57. සැකකරුවෙක් අත්අඩංගුවට ගැනීමේදී නිතීඥ සහාය ලබාගැනීමේ අයිතිය 2012 වර්ෂයේදී පොලිස්පතිවරයා විසින් ඉදිරිපත් කළ රෙගුලාසි ප්‍රකාරව පොලිස් පනතේ 55 වන වගන්තියෙන් තහවුරු කර ඇත. ඊට අනුව සැකකරුවා වෙනුවෙන් පෙනී සිටින නීතිඥවරයාට ඔහු අත්අඩංගුවේ පසුවන පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා හමුවීමටත්, අත්අඩංගුවට ගැනීමට මුල්වූ හේතු දැනගැනීමට ලැබීමත් තම සේවාදායකයා වෙනුවෙන් පෙනී සිටීමටත් එමගින් අවසර ලැබී ඇත. මෙයට අමතරව අපරාධ නඩු විධිවිධාන සංග්‍රහය (විශේෂ) සංශෝධන පනත් කෙටුම්පතට කැබිනට් මණ්ඩලයේ අනුමැතිය හිමිවී ඇති අතර එමගින් අපේක්ෂා කෙරෙන්නේ පොලිස්පතිවරයා ඉදිරිපත් කළ රෙගුලාසි නීතිගත කිරීමයි. මානව හිමිකම් කොමිෂන් සභාවේ, එක්සත් ජාතීන්ට අයත් සංවිධාන සහ සිවිල් සමාජයේ නිර්දේශ ඇතුලත් කිරීමෙන් පසුව එම පනත් කෙටුම්පත අනුමැතිය සඳහා පාර්ලිමේන්තුව වෙත යොමු කිරීමට නියමිතය.

58. අධිකරණ අමාත්‍යවරයා විසින් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරු දෙදෙනෙකුගේ මූලිකත්වයෙන් යුත් නීති විශේෂඥයින්ගේ ද සහභාගිත්වයෙන් යුත් විශේෂ කමිටු දෙකක් පත්කරන ලදී. එහි අපේක්ෂිත කාර්යය වී ඇත්තේ දණ්ඩ නීති සංග්‍රහය හා අපරාධ නඩු විධිවිධාන සංග්‍රහය සංශෝධනය කිරීමයි. ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ලංකාවේ අපරාධ නීතිය සංශෝධනය කිරීම එහි අරමුණයි.

59. 2015 දෙසැම්බර් මසදී රජය ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත හා හදිසි නීතිය යටතේ චෝදනා ගොනු නොකර රඳවා තබාගෙන ඇති රැඳවියන් සම්පූර්ණයෙන්ම නිදහස් කිරීමට ප්‍රතිපත්තිමය තීරණයක් ගත්තේය.. එහි ප්‍රතිපලයක් ලෙස මෙම වාර්තාව භාර දෙන අවස්ථාව වනවිට කිසිදු රැඳවියෙකු විධායක බලතල මත විශේෂ නීති යටතේ රඳවා තබාගෙන නොමැත. මේ අතර චෝදනා ගොනුකර ඇති සැකකරුවන්ගේ නඩු ඉක්මණින් විමර්ශනය කර අධිචෝදනා පත්‍ර ගොනු කිරීමට යොමු කර ඇත. අනුරාධපුරය හා කොළඹ දිස්ත්‍රික්ක තුළ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සහ හදිසි අවස්ථා රෙගුලාසිවලට අදාළ නඩු ඉක්මණින් විභාග කිරීම සදහා විශේෂ අධිකරණ දෙකක් පිහිටුවා ඇත.

60. දැනට පවතින ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත වෙනුවට අන්තර්ජාතික මානව හිමිකම් ප්‍රමිතීන්ට අනුකූල ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතක් ගෙනඒමට රජය පියවර ගනිමින් සිටී. මෙම යෝජිත ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත පිළිබඳ ප්‍රතිපත්ති කෙටුම්පතක්ද නෛතික රාමුවක්ද විශේෂඥ සහාය ඇතිව කෙටුම්පත් කරන ලද අතර එයට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී තිබේ. එක්සත් ජාතීන්ගේ ත්‍රස්තවාදය පිටුදැකීමේ කමිටුව විසින් ඉදිරිපත් කළ නිර්දේශ නව කෙටුම්පත සකස් කිරීමේ ක්‍රියා වලියේදී සැලකිල්ලට ගන්නා ලදී.

<u>වධහිංසාවන්ට ලක්නොවීමේ අයිතිය</u>

2012 වාර්තාව පරිච්ඡේද 128 නිර්දේශයන් - 60,61,62,63, 76

61. ශ්‍රී ලංකා රජය වධහිංසාවන්ට ලක්වීම යන විෂයෙහි මුහුණපා සිටින අභියෝග මැනවින් හඳුනාගෙන සිටී. ශ්‍රී ලංකාව, වධහිංසා කිසිදු අයුරකින් නොඉවසා සහමුලින්ම තුරන් කිරීමේ පිළිවෙතක් අනුගමනය කරන අතර, මෙම වධ හිංසාවන්ට ලක් කිරීම පිළිබඳව රාජ්‍ය නිලධාරීන් වෙත එල්ල වන චෝදනා සම්බන්ධයෙන් දැඩිව අවධානය යොමු කර සිටියි. මේ සම්බන්ධයෙන් ධනාත්මක වෙනස්කම් ගතවූ වසර දෙකක කාලය තුළ සිදුව ඇත. ශ්‍රී ලංකා රජයේ වධහිංසා සම්බන්ධ ප්‍රතිපත්තිය මේ වර්ධනයට හේතු වී තිබේ.

62. මුලින්ම සදහන් කළ යුතු වන්නේ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමේ ස්වාධීනත්වය තහවුරු කර ඇති බවයි. ඒ හරහා රටේ ප්‍රමුඛතම මානව හිමිකම් සුරකීමේ ආයතනයට තම විෂය සම්බන්ධයෙන් කරුණු නිවැරදිව වාර්තා කිරීමට අවශ්‍ය පසුබිම සැලසී තිබෙන අතර, සුදුසු අවස්ථාවන් හි ඒ සඳහා අත්‍යවශ්‍ය වර්ධනයන් සිදුකිරීමට රජය සම්බන්ධ කරගැනීමේ හැකියාව ද පවතී. වධහිංසා සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම වර්තමානයේ සිදුකරන වාර්තා කිරීම ඉහත සඳහන් කළ නව ස්වාධීනත්වයේ සෘජු ප්‍රතිඵලයකි. වධහිංසා පිටුදැකීම වෙනුවෙන් වූ පූර්ණ උපාය මාර්ගය වන්නේ තිරසාර වශයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමේ මැදිහත්වීම් ශක්තිමත් කිරීමයි.

63. දෙවනුව වධහිංසා සම්බන්ධ සිද්ධීන්වලින් සහන ලබාගැනීම සඳහා වින්දිතයන්ට තවදුරටත් ජාත්‍යන්තර යාන්ත්‍රණයක සහාය ලබා ගැනීමේ අවස්ථාව හිමි කරදී තිබේ. වධහිංසාවට එරෙහි සම්මුතියේ ප්‍රතිපාදන ශ්‍රීලංකාව තුළ උල්ලංඝණයට ලක්වූ බව කියන, මෙරට අධිකරණ බලයට යටත්වන පුද්ගලයන්ගෙන් හෝ ඔවුන් වෙනුවෙන් පැමිණිලි පිළිගැනීම හා ඒසම්බන්ධයෙන් අවධානය යොමුකිරීමෙහි ලා වධහිංසා පිටුදැකීමේ කමිටුවේ නීත්‍යානුකූල බව පිළිගෙන 2016 අගෝස්තු 06 වෙනි දා වධහිංසාවට එරෙහි සම්මුතියෙහි 22 වගන්තිය යටතේ ශ්‍රී ලංකාව ප්‍රකාශයක් ඉදිරිපත් කලේය. මේ අනුව ඕනෑම ස්වාධීන පුද්ගලයෙකුට වධහිංසාවන්ට එරෙහි කමිටුවට තොරතුරු ඉදිරිපත් කළ හැකිය. ශ්‍රී ලංකා රජය මෙම කමිටුවට සහාය දැක්වීමට කටයුතු කරන අතර, කමිටුව විසින් ඉදිරිපත් කරන රටේ නීතියට අනුකූලවන නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කරයි. මෙම කමිටුවේ නීත්‍යානුකූල බව පිළිගැනීම මගින් දේශීය වශයෙන් පවතින විසඳුම් අවසන් වූ පසු

වින්දිතයන්ට යොමුවිය හැකි වෙනත් විකල්පයන්වර්ධනය කෙරේ. ශ්‍රී ලංකාවෙන් වධහිංසා සහමුලින්ම තුරන් කිරීමේ සමස්ත රාමුව මේ තුළින් ශක්තිමත් වෙයි.

64. තුන්වෙනුව වධහිංසා ඇතිවීම වළක්වා ගැනීම සඳහා සැකකරුවන් අත්අඩංගුවට ගෙන රඳවා තබා ප්‍රශ්න කිරීමට අදාළ නියෝග නිකුත් කර ඇත. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සැකකරුවන් අත්අඩංගුවට ගැනීම හා රඳවා තබා ගැනීමේ දී අනුගමනය කළ යුතු ප්‍රමිතීන් හා ක්‍රියාවලිය සම්බන්ධයෙන් ගරු ජනාධිපතිවරයා සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම ත්‍රිවිධ හමුදාවටත්, පොලිසියටත් විධිවිධාන නිකුත් කර තිබේ. අදාළ නියෝග පිළිවෙලින් 2016 මැයි හා ජූනි මාසවලදී නිකුත් කෙරිණ. ඒ මගින් වධහිංසා පැමිණවීම තහනම් කර ඇති අතර, 1994 වධහිංසාවට එරෙහි පනත යටතේ පරීක්ෂණ සිදු කිරීම, චෝදනා ඉදිරිපත් කිරීම සහ වැරදිකරුවන්ට දඬුවම් පැමිණවීමට ඇති රාජ්‍ය අභිප්‍රාය තවදුරටත් සවිගන්වනවා ඇත.

<u>බලහත්කාරයෙන් අතුරුදන් කරවීම</u>

පරිච්ඡේද 127 සඳහන් නිර්දේශ (2012) – 3, 4, 60 සහ පරිච්ඡේද 128 (2012) – 1,2,3,4,5

65. අතීත අතුරුදන්වීමේ සිද්ධි විමර්ශනය කිරීම මෙන්ම අනාගතයේදී අතුරුදන්වීම් නැවත ඇතිවීම වැළැක්වීම සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා රජය ධනාත්මක පියවර රැසක් ගෙන තිබේ. මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැළිගොඩ මහතාගේ අතුරුදන්වීමේ සිද්ධිය සම්බන්ධයෙන් ප්‍රගතියක් අත්පත් කරගෙන තිබේ. සැකකරුවන් කිහිප දෙනෙක් අත්අඩංගුවට ගෙන ඇප මත මුදා හැර තිබේ. විමර්ශන කටයුතු අවසන් වූ පසුව චෝදනා ඉදිරිපත් කිරීම නැවත ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ.

66. 2016 මැයි මාසයේදී ශ්‍රී ලංකාව පුද්ගලයන් බලහත්කාරයෙන් අතුරුදන්කිරීමට එරෙහි ජාත්‍යන්තර සම්මුතියට අපරානුමැතිය ලබා දුන්නේය. මෙම අපරානුමැතියෙන් අනතුරුව සම්මුතියේ ප්‍රතිපාදන දේශීය වශයෙන් බලාත්මක කිරීම සඳහා විශේෂඥයින්ගෙන් සැදුනු කමිටුවක් නීති සම්පාදනය කරනු ලැබීය. පුද්ගලයන් බලහත්කාරයෙන් අතුරුදන්කිරීමට එරෙහි සම්මුතිය පනතේ කෙටුම්පතට කැබිනට් මණ්ඩල අනුමැතිය හිමිවූ අතර 2017 මාර්තු මස එය පාර්ලිමේන්තු න්‍යාය පත්‍රයට ද ඇතුලත් කෙරිණ. බලහත්කාරයෙන් අතුරුදන්කරවීම අපරාධයක් වශයෙන් නම් කරන ලෙස ද, වින්දිතයින්ගේ පවුලේ සාමාජිකයන්ට වන්දි ලබාගැනීමේ දී හා ඔවුන් පිළිබඳ තොරතුරු සෙවීමේ දී කාර්යයක්ෂම පිළියම් ලබාදෙන මෙන්ද කෙටුම්පතින් යෝජනා කර ඇත.

67. අස්වේච්ඡ හෝ බලහත්කාරයෙන් අතුරුදන්කරවීම පිළිබඳව කටයුතු කරන එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ක්‍රියාකාරී කණ්ඩායම පෙන්වා දුන් අතුරුදන්වීමේ සිද්ධි 1688 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය ප්‍රතිචාර දක්වා තිබේ. මෙම ක්‍රියාකාරී කණ්ඩායම 2015 නොවැම්බර් මස 9 වෙනි දා සිට 18 වෙනිදා දක්වා මෙරට සංචාරය කළ අතර රැඳවුම් මධ්‍යස්ථාන වෙත පිවිසීමට ශ්‍රී ලංකාව පළ කළ සහාය ඔවුන්ගේ පැසසුමට ලක් විය.

68. අතුරුදන්වීමේ සිද්ධි රැසක් සම්බන්ධයෙන්ම ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් විශ්වාස කරන්නේ අදාළ පුද්ගලයා තවමත් ජීවතුන් අතර සිටින බවයි. මෙය සැලකිල්ලට ගෙන රජය විසින් වසර 2016 දී 2010 අංක 19 දරන මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලිකව විධිවිධාන) (සංශෝධන) පනත හඳුන්වා දුන්නේය. මේ හරහා මරණ සහතිකය වෙනුවට දක්නට නොමැති බවට සහතිකයක් නිකුත් කිරීමෙන් අතුරුදන්වූ පුද්ගලයාගේ පවුලේ සාමාජිකයන්ට ඉඩම් පරිහරණය කිරීමේ අයිතිය හා අතුරුදන්වූ තැනැත්තාගේ බැංකු ගිණුම්වලින් මුදල් ගැනීමේ අයිතිය සැලසේ. ජාතික සමගිය හා සංහිඳියාව පිළිබඳ කාර්යාලය මෙම වැඩපිළිවෙල සඳහා පහසුකම් සපයා ඇති අතර පුද්ගල උපත් සහ මරණ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා දක්නට නොමැති බවට සහතික නිකුත් කිරීම සඳහා අයදුම්පත් කැඳවා තිබේ.

භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස

පරිච්ඡේද අංක 128 (2012) සඳහන් නිර්දේශ - 27, 49, 83, 87

69. 2016 අගෝස්තු මස රජය විසින් 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනත බලාත්මක කරන ලදී. නව පනත තුළින් ශ්‍රී ලංකාවේ භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස සහ මාධ්‍ය නිදහස තවත් ඉදිරියට ගෙනයාමක් සිදු කළේය. මෙම පනත යටතේ මහජනයාගේ ඉල්ලීම පරිදි ඔවුන්ට අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා සෑම රාජ්‍ය ආයතනයක්ම තොරතුරු නිලධාරියෙකු පත් කළ යුතුව ඇත. නව පනත මගින් රාජ්‍ය ආයතනයන් සක්‍රීයව තොරතුරු ලබාදීම කෙරෙහි උනන්දු කෙරෙන අතර, ඒ හරහා විවෘතභාවයෙන් යුත් සංස්කෘතියක් සඳහා ප්‍රගමනයක් ඇතිකිරීම අපේක්ෂාවයි. තොරතුරු දැනගැනීමේ ස්වාධීන කොමිසමක් ද මෙම පනත හරහා ස්ථාපිත කර ඇති අතර, මේ තුළින් නව පනත නිසිලෙස ක්‍රියාත්මකවීම සොයාබලමින්, පුරවැසියන්ගෙන් පැමිණිලි ලබා ගැනීම හා ඒවා නිරාකරණය ද සිදු කරයි. 2017 පෙබරවාරි මාසයේදී මෙම නීතිය ක්‍රියාවට නැංවුණ අතර තොරතුරු දැනගැනීම වෙනුවෙන් මහජනයා එය මැනවින් ප්‍රයෝජනයට ගැනීම ආරම්භ කර තිබේ.

70. 2015 ජනවාරියේ සිට ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහස සම්බන්ධයෙන් පැවති වාතාවරණය කැපී පෙනෙන අයුරින් වෙනස් වී ඇත. මේ කාලයේදීම විදුලි සංදේශ නියාමන කොමිසම වෙත කෙරුණු ජනාධිපතිවරයාගේ උපදෙස් අනුව, නව වෙබ් අඩවි සම්බන්ධයෙන් පැවති සීමාවන් ඉවත් කරනු ලැබීය. රජය විවේචනය කරන වෙබ් අඩවි ඇතුලුව ප්‍රවෘත්ති වෙබ් අඩවි වලට නිදහසේ සීමාවකින් තොරව කටයුතු කිරීමේ හැකියාව හිමිව තිබේ. විදෙස් මාධ්‍යවේදීන්ට උතුරු නැගෙනහිර සංචාරය කිරීමේ හැකියාව ඇතුලුව ජනමාධ්‍ය වේදීන්ගේ නිදහස සම්බන්ධව පැවති සීමාවන් ද ඉවත් කර ඇත.

71. මාධ්‍යවේදීන්ට පහර දීමේ අතීත සිදුවීම් සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කරන ආයතන විමර්ශන කටයුතු ආරම්භ කර තිබේ. උදාහරණයක් ලෙස 2009 සිදුවූ සන්ඩේ ලීඩර් පුවත්පතේ ප්‍රධාන කර්තෘ ලසන්ත වික්‍රමතුංග මහතාගේ ඝාතන සිද්ධියේ විමර්ශන නැවත ආරම්භ වීම දැක්විය හැක. 2017 පෙබරවාරි මාසයේදී එම ඝාතනය හා සම්බන්ධ පුද්ගලයන් කිහිපදෙනෙකු අත් අඩංගුවට ගැනිණ.

සිතීමේ, හෘද සාක්ෂියේ සහ ආගමික නිදහස

පරිච්ඡේද 127 (2012) හි සඳහන් නිර්දේශ - 56, 57, පරිච්ඡේද 128 (2012) – 91

72. මෙරට තුළ කැමති ආගමක් ඇදහීමේ නිදහස සම්බන්ධ ගැටලුව පිළිබඳ දැඩි අවධානයක් යුද්ධයෙන් පසුව හටගත්තේ, අන්තර් ආගමික වශයෙන් ඇතිවූ කලහකාරී සිදුවීම් හා සම්බන්ධව එල්ලවූ චෝදනා හේතුවෙනි. මේ සම්බන්ධයෙන් ආගම් අතර වෛරය ඇතිකිරීම අපරාධ වරදක් ලෙස නීතිගතකර ඇති සිවිල් හා දේශපාලන අයිතීන් සම්මුතිය පනතේ 3(1) වගන්තිය බලාත්මක කිරීමට 2017-2021 සඳහාවූ ජාතික මානව හිමිකම් පිළිබඳ ක්‍රියාකාරී සැලැස්මෙහි වැදගත් ස්ථානයක් දී ඇත.

73. ජාතික සමගිය හා සංහිඳියාව සම්බන්ධ කාර්යාලයට පැවරී ඇති බලයට ආගම් අතර සහජීවනය ප්‍රවර්ධනය කිරීම සඳහා නිශ්චිත අවධානයක් යොමු කිරීම අයත්ය. අන්තර් - ආගමික අවබෝධය ප්‍රවර්ධනය කිරීම සඳහා සෑම ආගමකටම අයත් සිසුන් වෙනුවෙන් විවිධ උත්සව එම කාර්යාලය මගින් සංවිධාන කරයි. 2016 දී සංස්කෘතික හා ආගමික උත්සව 133 ක් බහු - සංස්කෘතික පදනමක් ඔස්සේ සමරනු ලැබූ අතර, ඒ සඳහා දිස්ත්‍රික්ක 21 ක් නියෝජනය කරමින් පාසල් 1009 ක සිසුන් 47, 500 දෙනෙකු සහභාගි වූහ. එපමණක් නොව, අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත සංහිඳියාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ, නීතියේ ආධිපත්‍යය පවත්වාගෙන යාම සහ ආගමික කණ්ඩායම් අතර සහජීවනය ප්‍රවර්ධනය කිරීමට අදාළ ප්‍රතිපත්තීන් අඩංගු වේ.

74. අන්තර් ආගමික ප්‍රචණ්ඩ ක්‍රියා සිදුවීමේ නැඹුරුවක් දක්වන භූගෝලීය ස්ථාන ජාතික සමගිය හා සංහිඳියාව සම්බන්ධ කාර්යාලය හඳුනාගෙන ඇති අතර, මෙකී ප්‍රදේශවල ගැටුම් පරිවර්තනය පිළිබඳ අන්තර් ක්‍රියාකාරී පුහුණුවක් සංවිධාන කලේය. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මේ සඳහා

සහයෝගය දැක්වූ අතර, එම සංවිධානය ආගමික ප්‍රචණ්ඩත්වය පිළිබඳ පෙර අනතුරු ඇඟවීමේ පද්ධතියක් ලෙස කටයුතු කරයි.

75. මේ අතර, 2014 ජූලි මාසයේ දී අලුත්ගමදී සිදුවූ ප්‍රචණ්ඩ ක්‍රියා වලට සම්බන්ධ බවට සැක කෙරෙන පුද්ගලයන්ට එරෙහිව 200 කට අධික පොලිස් වාර්තා මහේස්ත්‍රාත් උසාවියේ ගොනු කර ඇත. මෙම වාර්තාවල අඩංගු සාක්ෂි පදනම් කරගෙන සැකකරුවන්ට එරෙහිව චෝදනා ඉදිරිපත් කෙරෙනු ඇත.

<u>භාෂාව</u>

පරිච්ඡේද 127 (2012) සඳහන් නිර්දේශ - 55 ; පරිච්ඡේද 105 (2008) සඳහන් ස්වේච්ඡා ප්‍රතිඥා ; පරිච්ඡේද 4.1 (2003) සඳහන් ස්වේච්ඡා ප්‍රතිඥාව

76. ශ්‍රී ලංකාවේ නිල භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම කෙරෙහි මෙන්ම, ත්‍රෛභාෂික ශ්‍රී ලංකාවක් සඳහා දස වසරක ජාතික සැලැස්ම සඳහා රජය ප්‍රමුඛතාවය ලබා දී තිබේ. රටේ සංහිඳියා ක්‍රියාවලිය ප්‍රවර්ධනය සඳහා ඉහත සඳහන් ප්‍රතිපත්තිය හා සැලැස්ම ක්‍රියාත්මක කිරීම අතිශය වැදගත් වන අතර, රාජ්‍ය සේවාවන් සඳහා පුරවැසියන්ට අර්ථවත්ව පිවිසිය හැකිවීම සහතික කිරීම ද අපේක්ෂා කෙරේ. 2016 දී සමාජ ඒකාබද්ධවීම වෙනුවෙන් වූ ජාතික සහජීවන ක්‍රියාකාරී සැලැස්ම සකස් කෙරුනේ තිරසාර සාමය සහ සංවර්ධනය, සහජීවනය සහ කුලුණු තුනක ආචාරධර්ම හරහා ගොඩනැගුණ සංහිඳියාව, අධ්‍යාපනය සහ සවිබල ගැන්වීමට ඉඩ ලබාදීම සඳහාය.

77. මෙකී සන්දර්භය තුළ භාෂා අයිතීන් හා සම්බන්ධව තම ඉලක්කයන් මුදුන් පමුණුවා ගැනීම සඳහා ශ්‍රී ලංකා රජය වැඩදායක පියවර රාශියක් ගෙන තිබේ. පළමුව භාෂා මාර්ගෝපදේශනයක් ඔස්සේ ජාතික ධාරිතාවන් ගොඩනැගීමට අරමුණු කර ඇත. ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වී තිබෙන 4,861 කට අධික භාෂා, සහජීවන සමාජ ප්‍රජාව තුළ ස්ථාපිත වී ඇත. වර්තමානය වන විට පුද්ගලයන් 15,000 කට වැඩි පිරිසකට රාජ්‍ය භාෂා ඉගැන්වීම සඳහා භාෂා පන්ති 600 ක් ක්‍රියාත්මක වෙමින් පවතී.

78. මහජන ප්‍රතිචාර සහ අධ්‍යාපනය වෙනුවෙන් රජය වැඩපිළිවෙලක් සකස් කර ඇත. මහජනයාගේ පැමිණිලි වෙනුවෙන් ඇමතුම් මධ්‍යස්ථානයක් ද ස්ථාපිත කෙරිණ. 2012 දී මෙම මධ්‍යස්ථානයේ ස්ථාපිතවීමත් සමගම ඊට මසකට ඇමතුම් 100 – 150 ත් අතර සංඛ්‍යාවක් ලැබී ඇත. සිංහල හා දෙමළ ප්‍රජාව අතර සන්නිවේදන පරතරය හේතුවෙන් මතුව ඇති ගැටලුවලට පිළියමක් වශයෙන් www.bhashawa.lk වෙබ් අඩවිය දියත් කරන ලදී. මෙහි අරමුණ වන්නේ ද්වීභාෂා හා ත්‍රෛභාෂා අවශ්‍යතා සඳහා පරිවර්තකයෙතුගේ සේවය ලබාගැනීමට අවකාශ සැලසීමයි.

79. තෙවනුව දේශීයව සේවාවන් ලබාදීමේ ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම සඳහා තෝරාගත් මහනගර සභා, නගර සභා, පොලිස් ස්ථාන, ජාතික රෝහල්, ද්විභාෂා දිස්ත්‍රික්ක සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ද්විභාෂා පහසුකම් සැලසෙන කුටි 72 ක ආදර්ශ කලාප ස්ථාපිත කර ඇත. අනෙකුත් ස්ථානවල ද මේ කලාපවල ආකෘතීන් ක්‍රියාවට නංවනු ලැබේ. රටේ සෑම පොලිස් ස්ථානයකම ද්විභාෂා හැකියාවක් සහිත නිලධාරියෙකු පැය 24 පුරාම අනුයුක්ත කිරීමට අවශ්‍ය පියවර ගනිමින් තිබේ.

80. දැනටමත් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය නිසි ලෙස ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීම සඳහා ගෙන ඇති පියවර වලට අමතරව, සියලු රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන වල මෙන්ම පොදු ස්ථානයන්හි මහජනතාවගේ මග පෙන්වීම සහ පහසුව සඳහා ද්විභාෂාවෙන් හා භාෂා තුනෙන්ම දැන්වීම් පුවරු සවිකළයුතු යයි 2017 මැයි 9 වැනි දින අමාත්‍ය මණ්ඩලය තීරණය කළේය. මෑත කාලීන නීති ප්‍රතිසංස්කරණ වලින්ද මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිළිබිඹු කරයි. උදාහරණයක් ලෙස, 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරී පනතේ 120 (5) කොටසේ මෙසේ සඳහන් වේ: "ඖෂධවේදියකු විසින් යම් ඖෂධයක්, වෛද්‍ය උපකරණයක් හෝ සීමාස්ථ නිෂ්පාදනයක් නිකුත් කිරීමේදී , පාරිභෝගිකයා විසින් ඉල්ලා සිටිනු ලබන භාෂාවකින් එකී ඖෂධය, වෛද්‍ය උපකරණය හෝ සීමාස්ථ නිෂ්පාදනය පිළිබඳ විස්තරයක් එකී පාරිභෝගිකයාට ලබා දිය යුතුය.”

**ආර්ථික, සමාජයීය හා සංස්කෘතික හිමිකම්**

**සෞඛ්‍ය පහසුකම් ලැබීමට ඇති හිමිකම**

2008 ඡේද 95 සඳහන් ස්වේච්ඡා ප්‍රතිඥාව

81. සෞඛ්‍ය පහසුකම් වෙනුවෙන් ආයෝජනය කිරීම මගින් දුගීභාවය තුරන් කිරීම සහ සහශ්‍ර සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගැනීම වෙනුවෙන් ක්‍රියා කිරීමට ශ්‍රී ලංකාව ස්වේච්ඡා පොරොන්දුවක් දී ඇත. වයස අවුරුදු තුනට අඩු ළමුන්ගෙන් සියයට 98.5 කට වඩා එන්නත් ලබාදීම මගින් ශ්‍රී ලංකාව මේ සම්බන්ධයෙන් සාධනීය ප්‍රතිපල අත්කරගෙන තිබේ. වයස අවුරුදු පහෙන් ඉහළ ළමුන්ගෙන් සියයට 86.6 ක් ඩිප්තීරියා, පිටගැස්ම හා පෝලියෝ සඳහා එන්නත් කර ඇත. මේ අතර 1996න් පසු ශ්‍රී ලංකාවෙන් පෝලියෝ රෝගය වාර්තා නොවී තිබීම සැලකිය යුතු කරුණකි. මෙයට අමතරව 1991 දී ජීව උපත් දහසකට 22.2 ක් වූ උපතේදී ළමා මරණ ප්‍රතිශතය 2013දී ජීව උපත් දහසකට 6.5 ක් දක්වා අඩු වී ඇත.

82. වසර 2013 දී පළපුරුදු වින්නඹු සේවිකාවකගේ සහභාගිත්වය ඇතිව සිදුවූ දරු උපත් ප්‍රතිශතය 99.8 ක් විය. වසර 2012/2013යේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ දරු ප්‍රසූති සංගණනය අනුව ශ්‍රී ලංකාවේ සිදුවන සියලුම දරු උපත් පාහේ සිදුවන්නේ පුහුණුව ලැබූ සෞඛ්‍ය සේවකයන්ගේ අධීක්ෂණය යටතේ යම්කිසි සෞඛ්‍ය මධ්‍යස්ථානයක වන අතර ඒවායින් සියයට 70කට වඩා සිදුවන්නේ ඒ පිළිබඳව වූ විශේෂිත මධ්‍යස්ථානයක ය.

83. වසර 2012-2017 සඳහාවූ ජාතික සෞඛ්‍ය සැලැස්මෙහි ජාතික මෙන්ම පළාත් මට්ටමෙන් මානව හා මූල්‍ය සම්පත් වැඩිකිරීමට ප්‍රමුඛතාවය දී ඇත. මේ සැලැස්ම අනුව වර්ෂ 2017 වනවිට ජනගහනයෙන් 3000කට එක් අයෙක් බැගින් මහජන සෞඛ්‍ය වින්නඹුවන්ගේ සංඛ්‍යාව වැඩි කිරීමටද ඩිප්තීරියා, පිටගැස්ම හා පෝලියෝ එන්නත් කිරීම සියයට සියයක් දක්වා වැඩි කිරීමටද අපේක්ෂා කෙරේ.

**<u>අධ්‍යාපනය ලැබීමට ඇති හිමිකම</u>**

2008 ඡේද 95 සඳහන් ස්වේච්ඡා ප්‍රතිඥාව

84. අධ්‍යාපනය වෙනුවෙන් ආයෝජනය කිරීම මගින් දුගීභාවය තුරන් කිරීම සාක්ෂාත් කරගැනීම වෙනුවෙන් ක්‍රියා කිරීමට ශ්‍රී ලංකාව ස්වේච්ඡා ප්‍රතිඥාවක් දී ඇත. මේ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා පළමු වසරේ සිට විශ්ව විද්‍යාල මට්ටම දක්වා නිදහස් අධ්‍යාපනය සැපයීම මෙන්ම අධ්‍යාපනය ලබාගැනීමේදී සැමට සමාන අවස්ථා ලබාදීම තහවුරු කිරීම සඳහා රජය විසින් වෙනත් බොහෝ දිරිගැන්වීම්ද කරනු ලැබේ. මෙහි ප්‍රතිපලයක් ලෙස සියයට 99.5ක් වූ ඉහළ අගයක ප්‍රාථමික අධ්‍යාපනය සම්පූර්ණ කිරීමේ අගයක් ශ්‍රී ලංකාව විසින් වාර්තාකර ඇත. ප්‍රාථමික අධ්‍යාපනය සඳහා ඇතුල්වීමේ ප්‍රතිශතය සියයට 98.26ක් වන අතර ප්‍රාථමික අධ්‍යාපනය හැර යන්නන්ගේ ප්‍රතිශතය සියයට 0.23 කි. වසර පහ දක්වා අධ්‍යාපනය සම්පූර්ණ කරන්නන්ගේ ප්‍රතිශතය සියයට 98.5 ක් වන අතර වසර නවය දක්වා අධ්‍යාපනය සම්පූර්ණ කරන්නන්ගේ ප්‍රතිශතය සියයට 97.8කි. මේ අතර ද්විතීයික අධ්‍යාපනය සඳහා ඇතුල්වීමේ ප්‍රතිශතය සියයට 98.5ක් වන අතර ද්විතීයික අධ්‍යාපනය සම්පූර්ණ කරන්නන්ගේ ප්‍රතිශතයද සියයට 98.5ක් වේ.

85. ජාතික මට්ටමේ අධ්‍යාපන ආයතන හා පළාත් අධ්‍යාපන බලධාරීන්ගේ අදහස් විමසීමෙන් අනතුරුව අධ්‍යාපන අමාත්‍යාංශය වසර 2012-2017 සඳහා වන වර්තමාන ජාතික අධ්‍යාපන සැලසුම සකස් කර ඇත. එය ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති, අන්තර්ජාතික බැඳීම්, අධ්‍යාපන පිළිබඳව වූ රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශ, සහ පළාත් අධ්‍යාපන බලධාරීන්ගේ අදහස් සැලකිල්ලට ගෙන සකස් කරන ලද පුළුල් සැලසුමකි. මේ අතර අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රාථමික අධ්‍යාපන අංශය විසින් වසර 2009දී ඕස්ට්‍රේලියානු රජය හා යුනිසෙෆ් ආයතනයේ සහභාගිත්වය ඇතිව ළමා හිතකර මාර්ගෝපදේශ සකස් කරන ලදී. මෙම ළමා හිතකර පාසල් සංකල්පය පළාත් පහක පාසල් 1500ක නියමු ව්‍යාපෘතියක්

ලෙස අත්හදා බැලීමෙන් පසු මෙම සංකල්පයේ ප්‍රධාන අංග රටෙහි ඇති 9,905ක් වන සියලුම පාසල් සඳහා වන අධ්‍යාපන ප්‍රතිපත්තියට ඇතුලත් කර ඇත.

86. ශ්‍රී ලංකා රජය අධ්‍යාපන ක්‍රමය තුළ ළමයින්ගේ අත්දැකීම් වර්ධනය කිරීමටද පියවර ගෙන ඇත. මේ අනුව ශිෂ්‍යයන්ට දිවා ආහාරයද, නිල ඇඳුම් හා අධ්‍යාපන මෙවලම්ද රජයෙන් සැපයේ. මෙයට අමතරව සියලුම රජයේ පාසල් වල ළමා ආරක්ෂණ කමිටු පිහිටුවන මෙන් උපදෙස් දෙමින් චක්‍රලේඛයක් නිකුත් කර ඇත.

87. ශ්‍රී ලංකාවේ දෙමළ මාධ්‍ය ගුරුවරුන්ගේ සංඛ්‍යාව වැඩිකිරීමේ අවශ්‍යතාව හඳුනාගත් රජය ඒ අනුව පළාත් කීපයක් සඳහා දෙමළ මාධ්‍ය ගුරුවරුන් 2,631 ක් අලුතෙන් බඳවාගෙන ඇත.

<u>වාසස්ථානයක් සඳහා හිමිකම</u>

2012 ඡේද 127 සඳහන් නිර්දේශය-88

88. 2015 නොවැම්බර් මස රජය විසින් සිදුකරන ලද ආරම්භක අවශ්‍යතා ඇගයුමට අනුව ගැටුම් පැවති ප්‍රදේශවල නිවාස 137,500 ක අවශ්‍යතාවයක් ඇති බව පෙනී ගොස් තිබේ. මෙම මුළු අවශ්‍යතාවයෙන් අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව සහනදායී මූල්‍යාධාර සැපයීම මගින් රජය විසින් නිවාස 65,000 ක් තැනීමට නියමිතය.මේ වැඩ සටහන මගින් අවතැන්වූවන්ට සහ නැවත පැමිණෙන අනාථයන්ට සමාජ යටිතල පහසුකම් හා සිය ජීවනෝපායේ ආරක්ෂාව සමග දැරිය හැකි මුදලකට නිවාස සපයා දෙනු ඇත. උතුරු හා නැගෙනහිර පළාත් වල ඇති හදිසි නිවාස අවශ්‍යතාව සපුරනු වස් නිවාස 8,000ක් ඉදිකිරීම පිණිස රජයේ අයවැය මගින් ප්‍රතිපාදන සලසා ඇත. එයට අමතරව උතුරු හා නැගෙනහිර පළාත් වල ඇති මඳ වශයෙන් හානිවූ නිවෙස් 1,000 ක් අලුත්වැඩියා කෙරෙනු ඇත.

89. මේ අතර ඉන්දීය රජයේ මූල්‍යාධාර ඇතිව නිවාස 46,000ක් ඉදිකිරීමට වැඩසටහනක් මීට පෙර ක්‍රියාත්මක කර තිබුණි. මෙම වැඩ සටහන යටතේ නිවාස 33,145ක් දැනටමත් ඉදිකර ඇත. මේ අතර පකිස්ථානු, කසක්ස්ථාන හා බහරේන රජයන්හි ආධාර ඇතිව මන්නාරමේ අවතැන් වූ ජනතාව උදෙසා නිවාස 518ක් ඉදිකරගෙන යනු ලැබේ. මෙයට අමතරව යුරෝපා සංගමයේ ආධාර වැඩසටහන යටතේ මුලතිවු, කිලිනොච්චි හා මඩකලපු දිස්ත්‍රික්ක වල නිවාස 3,000ක් ඉදි කිරීමට නියමිතය.

90. 'වතුකරයේ මානව සංවර්ධන භාරය' හරහා රේඛීය අමාත්‍යාංශ විසින් වතුකරයේ වෙසෙන පවුල් 169,000 ක නිවාස හා ජීවන මට්ටම සම්බන්ධ ගැටළු විසඳීම වෙනුවෙන් වැඩ සටහන් කීපයක් දියත් කර ඇත. ජලය, සනීපාරක්ෂාව, ප්‍රවේශ මාර්ග, විදුලි බලය, ප්‍රජා මධ්‍යස්ථාන, ළමා සංවර්ධන මධ්‍යස්ථාන හා ආගමික ස්ථාන හා වෙනත් පොදු පහසුකම් සහිත පොකුරු ක්‍රමයේ නිවාස යෝජනා ක්‍රමයක් වතුකරයේ ජනතාවගේ ආත්මාභිමානය ප්‍රතිෂ්ඨාපනය කිරීම හා වැඩිදියුණු කිරීම අරමුණු කරගෙන දියත් කර ඇත. මේ අතර බදුල්ල, නුවර එළිය, හා හැටන්හි ඉන්දීය රජයේ ආධාර ඇතිව නිවාස 4,000ක් ඉදි කෙරෙන වැඩ සටහනක් 2015 ජනවාරි මස දියත් කරන ලදී. මේ වැඩ සටහන 2017 දී සම්පූර්ණ වීමට නියමිතය.තව ද, වතුකරයේ ජනතාවගේ ආර්ථික, සමාජ හා ජීවන තත්ත්වය නගා සිටුවීම පිණිස 2015-2025 සඳහා වන වතුකරයේ ජනතාවගේ සමාජ සංවර්ධනය සඳහා ජාතික ක්‍රියාකාරී සැලැස්ම දියත් කරන ලදී.

<u>ජීවනෝපාය සැලසීම හා දුගීභාවය තුරන් කිරීම</u>

2012 ඡේද 127 සඳහන් නිර්දේශය -
2013 ඡේද 4.6, 4.16 සඳහන් ස්වේච්ඡා ප්‍රතිඥාව

91. එක්සත් ජාතීන් විසින් ප්‍රකාශයට පත් කරන ලද තිරසාර සංවර්ධන වැඩසටහනේ පළමු අරමුණ වන, දරිද්‍රතාව තුරන් කිරීම පිණිස රජය සිය ඉහළ ප්‍රමුඛතාවය ලබා දී ඇත. රජයේ නව ආර්ථික ප්‍රතිපත්තියේ දිශානතිය සමාජ ආරක්ෂණය, ආදායම් ව්‍යාප්තියේ විෂමතා, ආර්ථික හා සමාජයීය

වශයෙන් අසරණ අයවළුන් සහ පළාත් සහ දිස්ත්‍රික් මට්ටමින් පවත්නා සංවර්ධනයේ අසමතුලිතතාවයන් සැලකිල්ලට ගෙන සකස් කර ඇත.

92. ගරු ජනාධිපතිතුමා විසින් කළ යෝජනාවකට අනුව රජය මෙම 2017 වසර 'දිළිඳුකම තුරන් කිරීමේ වර්ෂය' ලෙස ප්‍රකාශයට පත් කිරීමට 2016 අගෝස්තු මාසයේ දී තීරණය කර ඇත. එලෙසම මෙම කරුණ සඳහා මගපෙන්වීමටත් සියලුම අමාත්‍යවරුන්, පළාත් සභා, ව්‍යවස්ථාපිත ආයතන සහ සංස්ථා, පුද්ගලික අංශය හා රාජ්‍ය නොවන හවුල්කරුවන්ගේ සහභාගිත්වයෙන් දිළිඳුකම තුරන් කිරීමේ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහාත් රජය ගරු ජනාධිපතිතුමාගේ සභාපතිත්වයෙන් හා ගරු අගමැතිතුමා සහ අදාළ ඇමතිවරුන්ගෙන් සමන්විත පුළුල් බලතලවලින් යුත් කමිටුවක් පත්කිරීමට තීරණය කළේය. මෙම ප්‍රතිපත්තියේ මූලික අරමුණ වසර 2030 දී ශ්‍රී ලංකාව දිළිඳුකමෙන් තොර රටක් බව සහතික කිරීමයි. මේ අනුව, දිළිඳුකම තුරන් කිරීමෙහිලා ප්‍රජාව මත පදනම් වූ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ප්‍රවේශයක් ඔස්සේ රාජ්‍ය හා පෞද්ගලික අංශ මෙන්ම මහජනතාව සම්බන්ධීකරණය කිරීම සඳහා කෙලින්ම ගරු ජනාධිපතිතුමා යටතේ පවතින කාර්යාංශයක් ස්ථාපිත කර ඇත. මේ අතර, 2020 වසර වන විට ගම් 15,000 පදිංචිකරුවන්ගේ මූලික අවශ්‍යතාවන් ඉටු කිරීම අරමුණු කරගත් 'ග්‍රාමශක්ති ජනතා ව්‍යාපාරය', 2017 මැයි 4 වන දින ආරම්භ කරන ලදී. මෙම වැඩසටහනේ අරමුණ ආර්ථික වශයෙන් සමෘද්ධිමත් මෙන්ම සිය අයිතීන් අවබෝධ කර ගැනීමටත් සිය යුතුකම් ඉටු කිරීමටත් සමත් පුරවැසියන් නිර්මාණය කිරීම වේ.

93. සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය හා ජාතික සමගිය හා සංහිඳියාව පිළිබඳ කාර්යාලය ඒකාබද්ධව ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර පළාත් සඳහා දිස්ත්‍රික් සංවර්ධන වැඩ සටහන් සකස් කර ඇත. මේ වැඩසටහන කෙටුම්පත් කරන ලද්දේ දිසා ලේකම්වරු, සංවර්ධන ආයතන සහ ප්‍රජා නායකයන්ගේ අදහස් විමසීමෙන් අනතුරුවය. මේ වැඩසටහනෙහි මාර්ග, වාරිමාර්ග, ග්‍රාමීය සෞඛ්‍ය සායන, පාසැල්, නිවාස සහ වැව් අමුණු ප්‍රතිසංස්කරණය යන අංශ ආවරණය වේ.

94. දුගී භාවය තුරන්කිරීම අරමුණු කරගත් වැඩසටහන් කීපයක් දැනට ක්‍රියාත්මක වේ.උදාහරණයක් ලෙස මේ යටතේ යාපනය විශ්ව විද්‍යාලයේ අධීක්ෂණය යටතේ කිලිනොච්චියේද, රුහුණු විශ්ව විද්‍යාලයේ අධීක්ෂණය යටතේ හම්බන්තොටද කුඩා පරිමාණ ගොවීන් 300ක් දෙනෙක් බිඳිති වාරිමාර්ග ක්‍රමයෙන් වියළි බිම් කඩෙහි එළවළු හා පළතුරු වගා කිරීම පුහුණු කිරීම පිණිස ආදර්ශ ගොවිපොළවල් දෙකක් ඉදිකරගෙන යනු ලැබේ.මේ ක්‍රමයෙන් ජලය හා පොහොර සංරක්ෂණයට මෙන්ම ඔවුන්ගේ අස්වැන්නත් ආදායමත් දෙගුණ කිරීමටද ඉඩ සැලසෙනු ඇත.

95. සිය ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය යටතේ පුනරුත්ථාපන අධිකාරිය විසින් කලින් අවතැන්ව සිටි පවුල් 6,286 කට ජීවනෝපාය සලසා ගැනීම සඳහා කටයුතු සලසා දී ඇත. එයට අමතරව පුනරුත්ථාපන අධිකාරිය විසින් නැවත පදිංචි කරන ලද ප්‍රදේශවල පවුල් 60,000කට වැඩි සංඛ්‍යාවකට වන්දි මුදල් ගෙවීමද, පවුල් 4,000 කට වැඩි සංඛ්‍යාවකට ස්වයං රැකියා සඳහා ආධාර කිරීමද, පවුල් 500කට වැඩි සංඛ්‍යාවකට නිවාස ණය ලබා දීමද සිදුකර ඇත.

96. මේ අතර සමාජ හා ආර්ථික අයිතීන්ට අදාළ ගැටළු හඳුනාගැනීම පිණිස රජය විසින් මේ වන විට රටෙහි සමාජ හා ආර්ථික තත්ත්වයන් පිළිබඳ දත්ත හා තොරතුරු රැස් කිරීම සිදු කර ගෙන යනු ලැබේ.

**වැඩ කිරීමේ අයිතිය හා සේවා ස්ථානයේදී මානව හිමිකම් ආරක්ෂා කිරීම**

2013හි 4.19 ඡේදයේ සඳහන් ස්වේච්ඡා ප්‍රතිඥාව

97. අංක 155 දරන ලෝක කම්කරු සංවිධාන ගිවිසුම බලාත්මක කරනු පිණිස ශ්‍රී ලංකා රජය වෘත්තීය ආරක්ෂණය, සෞඛ්‍යය, හා සුබසාධනය තහවුරු කිරීම පිණිස නීති හා රෙගුලාසි හඳුන්වා දීමට කටයුතු කරමින් සිටී. වෘත්තීය ආරක්ෂණය හා සෞඛ්‍යය 1942හි අංක 45 දරන කර්මාන්තශාලා ආඥාපනත මගින් පොදුවේ ආවරණය වේ. මෙම නීතියට අමතරව වෘත්තීය ආරක්ෂණය, සෞඛ්‍යය, හා සුබසාධනය පිළිබඳ පනතක් කෙටුම්පත් කරමින් පවතින අතර එය අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කෙරෙනු ඇත.

98. ශ්‍රී ලංකාවේ වෘත්තීය ආරක්ෂණය හා සෞඛ්‍යය පිලිබඳ ප්‍රතිපත්තියක් කම්කරු අමාත්‍යාංශය විසින් සෞඛ්‍ය අමාත්‍යාංශයේද සහාය ඇතිව 2014 ජුනි මාසයේදී පිළියෙළ කරන ලදී. මෙම ප්‍රතිපත්තිය, කෘෂිකර්මය, කර්මාන්ත, ඉදිකිරීම්, සංචාරක කර්මාන්තය, හා ප්‍රවාහන ක්ෂේත්‍රය යන සියලු ක්ෂේත්‍රයන්ට අදාළ වනු ඇත. මේ ප්‍රතිපත්තියේ ප්‍රධාන අරමුණ වන්නේ සේවය කරන පරිසරය වඩාත් යහපත් කරනු පිණිස ජාතික වෘත්තීය ආරක්ෂණ හා සෞඛ්‍ය ක්‍රමවේදයක් සහ වැඩසටහන් සකස් කිරීමයි.

99. රැකියාවට සම්බන්ධ ආරක්ෂාව හා සෞඛ්‍යය පිළිබද ජාතික ආයතනය 2009 වසරේදී ස්ථාපිත කෙරිණ. මෙම ආයතනය මගින් සේවාදායකයන්ට, සේවායෝජකයන්ට, වෘත්තීය සමිති සහ රාජ්‍ය නිලධාරීන්ට සේවා ස්ථානයේ සිදුවන අනතුරු සහ මතුවිය හැකි අසනීප තත්ත්වයන් පිළිබදව දැනුවත් කිරීමට හා පුහුණුවක් ලබාදීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කරයි.

## C. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ හෝ කණ්ඩායම් හි අයිතීන්

<u>කාන්තාවෝ</u>

පරිච්ඡේද 127 (2012) සඳහන් නිර්දේශ - 2, 61, 62, 63, 64, 65, 66, 68, 69 පරිච්ඡේද 128 (2012) – 55 ; පරිච්ඡේද 98, 99 (2008) සඳහන් ස්වේච්ඡා ප්‍රතිඥා ; පරිච්ඡේද 4.10, 4.11 (2013) සඳහන් ස්වේච්ඡා ප්‍රතිඥා

100. ශ්‍රී ලංකා රජය කාන්තාවන්ගේ අයිතීන් ආරක්ෂා කිරීමට හා ප්‍රවර්ධනය කිරීම සඳහා ධනාත්මක පියවර රැසක් ගෙන තිබේ. තවද කාන්තා අයිතීන් සඳහා අනුබල සැපයෙන ප්‍රධාන ජාත්‍යන්තර ගිවිසුම් මැතකදී අනුමත කරන ලදී. උදාහරණයක් වශයෙන් පුද්ගලයන්, විශේෂයෙන් කාන්තාවන් හා ළමුන් ජාවාරම් කිරීම වැළැක්වීම, මැඩ පැවැත්වීම සහ දඬුවම් පැමිණවීම පිළිබඳ ප්‍රොටෝකෝලයක් රජය විසින් 2015 ජුනි මස 15 වෙනි දින අපරානුමත කරන ලදී. (පැලර්මෝ ප්‍රොටෝකෝලය) තවද පුද්ගලයන් ජාවාරම් කිරීම සම්බන්ධයෙන් අධිකරණ අමාත්‍යාංශය විසින් 2016 පෙබරවාරි මාසයේ ඉදිරිපත් කළ උපාය මාර්ගික සැලැස්ම රජය විසින් ක්‍රියාත්මක කරන ලදී.

101. 2016 ජනවාරි 12 වෙනිදා ගැටුම්වලදී ලිංගික හිංසනයන් වැළැක්වීමට කැපවන ප්‍රකාශනය ශ්‍රී ලංකා රජය විසින් අනුමත කරන ලදී. ගැටුම්වලදී ලිංගික හිංසනයන් වැළැක්වීම සාමයට, ආරක්ෂාවට සහ කිරසාර සංවර්ධනයට බෙහෙවින්ම වැදගත් වන බව රජය පැහැදිලිව හඳුනාගත් අතර, එවන් අපරාධයන්ට දඬුවම් ලබානොදී සිටීම වැළැක්වීමට ක්‍රියා කරන බව යළි යළිත් ප්‍රකාශ කලේය.

102. ශ්‍රී ලංකාවේ ලිංගභේදය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා පියවර කිහිපයක් ගෙන තිබේ. ප්‍රථමයෙන් උතුර හා නැගෙනහිර පළාත් ඇතුලුව කාන්තා නිලධාරිනියන්ගෙන් සමන්විත 'කාන්තා සහ ළමා' අංශ සෑම පොලිස් ස්ථානයකම ක්‍රියාත්මක වේ. ඒ තුළ විශේෂ පුහුණුවක් ලද පොලිස් නිලධාරිනියන් සේවය කරන අතර ළමුන්, කාන්තාවන්, ගැහැණු ළමුන් සහ ඔවුන්ගේ දෙමව්පියන්ට ලිංගික අතවර හා හිංසනයන්ට ලක්වීමේ සිදුවීම් නොබියව වාර්තා කිරීම සඳහා අවශ්‍ය ශක්තිය හා ආරක්ෂාකාරී වටපිටාව නිර්මාණය කර ඇත. මේ ක්‍රියාවලිය ජාතික ළමා ආරක්ෂක අධිකාරියට ද සම්බන්ධ කර ඇත. මේ අතර ලිංගභේදය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් උපකාර කිරීමේ අංශ යුද්ධයෙන් පීඩාවට පත්වූ ප්‍රදේශයන් හි රෝහල් තුළ පිහිටුවා තිබේ.

103. දෙවනුව, ශ්‍රී ලංකා පොලිසියේ කාන්තා හා ළමා කාර්යාංශය ලිංගභේදය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් දිවයින පුරා විසිරී සිටින කාන්තාවන්ගේ පැමිණිලි ලබාගැනීම හා ඊට කඩිනම් ප්‍රතිචාර දැක්වීම සඳහා ක්ෂණික ඇමතුම් අංකයක් ක්‍රියාත්මක කරයි.

104. තෙවනුව, ලිංගභේදය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් විශේෂයෙන් ගෘහස්ත හිංසනය සම්බන්ධයෙන් වඩා යහපත් ප්‍රතිචාරයක් සහ පිටුදැකීමක් උදෙසා, බහු කේන්ද්‍රීය පිවිසුමක් සහිත විශේෂඥවෙකු වෙත යොමු කෙරෙන ක්‍රමවේදයක් හඳුන්වාදෙන ලදී. ලිංගභේදය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය සම්බන්ධ ප්‍රතිචාර යාන්ත්‍රණය සමාලෝචනය කිරීම සඳහා නීතිය ක්‍රියාත්මක කරන

නිලධාරීන්, වෛද්‍යවරු, සෞඛ්‍යය සේවකයන්, ග්‍රාමීය නායකයන් හා පාසල්වල නියෝජිතයන් සමග රැස්වීම් පවත්වනු ලැබිය.

105. සිව්වෙනුව, නීති සම්පාදන හා ප්‍රතිපත්ති මට්ටමේදී 2005 අංක 34 දරණ ගෘහස්ත හිංසනය වැළැක්වීමේ පනත ශක්තිමත් කරමින් ක්‍රියාත්මක කිරීම සඳහා ලද ඉල්ලීම් සැලකිල්ලට ගෙන, විශේෂඥ කණ්ඩායමක් විසින් එම පනතට සංශෝධන කෙටුම්පත් සකස් කරන ලදී. තවද, ශ්‍රී ලංකාවේ ලිංගභේදය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය ආමන්ත්‍රණය කිරීම සඳහා ජාතික ක්‍රියාකාරී සැලැස්මක් වර්ධනය කිරීම කෙරෙහි කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය ප්‍රමුඛත්වය ගෙන ක්‍රියා කරයි. ජාතික මට්ටමේ උපදේශන හරහා එම සැලැස්ම මේ වන විට සංශෝධනයට ලක්වෙමින් පවතී. මේ අතර කාන්තා අයිතීන් උල්ලංඝණයවීම් සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි විමර්ශනය කෙරෙන කාන්තා කොමිසම පිහිටුවීම සඳහා කැබිනට් මණ්ඩල අනුමැතිය හිමිව තිබේ.

106. මෙකී පියවරයන්, ලිංගභේදය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය සම්බන්ධ සිදුවීම් විමර්ශනයට හා චෝදනා ඉදිරිපත් කිරීමට පහසුකම් සලසා ඇත. චෝදනා ලද සිදුවීම් පිළිබඳව ශ්‍රී ලංකා පොලීසිය විමර්ශන සිදු කරන අතර, ඊට අයත් සාක්ෂි අධිචෝදනා ගොනු කිරීම පිළිබඳව සලකා බැලීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කෙරේ. 2015 ඔක්තෝබර් මස 07 වෙනිදා යාපනය මහධිකරණය ආරක්ෂක අංශ සාමාජිකයන් සිව්දෙනෙකු විශ්වමඩු හි කාන්තාවක් දූෂණය කිරීම හා තවත් කාන්තාවකට ලිංගික හිංසනයන් සිදුකිරීමේ චෝදනාවන්ට වරදකරුවන් කළේය. මේ අතර ගෘහස්ත හිංසනය වැළැක්වීමේ පනත ගෘහස්ත හිංසනය සම්බන්ධ නඩුවලදී අර්ධ අධිකරණමය විසඳුමක් ලෙස රැකවරණ නියෝගයක් ඉදිරිපත් කරයි. පොලිසියට වැඩි වශයෙන් පැමිණිලි ලැබෙන්නේ ගෘහස්ත හිංසනය සම්බන්ධවයි. මේ නිසා පොලිස් නිලධාරීන්ට කාන්තා අයිතීන්, ගෘහස්ත හිංසනය ඇතුලුව ලිංගභේදය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳව පුහුණුවක් ලබාදී තිබේ.

107. කාන්තා අයිතීන් ඉහළ නැංවීමට ගෙන තිබෙන අනෙකුත් ක්‍රියාමාර්ග අතරට එල්.ටී.ටී.ඊ සංවිධානයේ සෙබලියන් ලෙස කටයුතු කළ කාන්තාවන්ට වෘත්තීය පුහුණුව ලබාදීම, යුක්තිය පසිඳ ලීමට ප්‍රවේශය සහ නීති ප්‍රතිසංස්කරණ අයත් වේ. පුනරුත්ථාපනය කරන ලද එල්.ටී.ටී.ඊ සාමාජිකාවන් සේවා නියුක්ත කිරීමේ අරමුණින් විශේෂ වෘත්තීය පුහුණු වැඩසටහන් සංවිධානය කර තිබේ. මේ හරහා දේශීයව මෙන්ම විදේශීය වශයෙන් ද ඔවුන්ට රැකියා අවස්ථා උදා වී ඇත. මේ අතර, පාලන ක්‍රියාවලියේ හා ප්‍රතිපත්ති සම්පාදනයේ සියලු මට්ටම් වලදී ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම්ව නිසි ප්‍රතිචාර දැක්වීම පිණිස එක් එක් රේඛීය අමාත්‍යාංශය යටතේ කාන්තා කේන්ද්‍ර නිලධාරිනියන් ස්ථාපිත කර තිබේ.

108. ස්ත්‍රීන් හට නීතිය ක්‍රියාත්මක කිරීමට ප්‍රවේශය සඳහා පහසුකම් සැලසීම වෙනුවෙන් උතුරු සහ නැගෙනහිර පළාත් තුළ දෙමළ භාෂාව කතා කරන පොලිස් නිලධාරිනියන් යොදවා ඇති අතර උපදේශනය, නීති ආධාර හා වින්දිතයන් සඳහා වාසස්ථාන සැපයීම වැනි සේවාවන් ද ශක්තිමත් කර ඇත.

109. කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම්වලට එරෙහි ජාත්‍යන්තර සම්මුතිය යටතේ සහතික කර ඇති අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම සඳහා 2017-2021 ජාතික මානව හිමිකම් පිළිබඳ ක්‍රියාකාරී සැලැස්ම තුළ විශේෂ ප්‍රතිපාදන අන්තර්ගතව ඇත. කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ශක්තිමත් කිරීම උදෙසා අපරාධ නීතිය සහ අදාළ නීතීන්ට සංශෝධනයන් ගෙන ඒම එමගින් නිර්දේශ කරයි. උදාහරණයක් ලෙස වෛද්‍ය හේතු මත ගර්භනී භාවය අවසන් කිරීම, වෛවාහක ස්ත්‍රී දූෂණය, අසාධාරණ පුද්ගලික නීති හා ගෘහස්ත ප්‍රචණ්ඩත්වය යන අංශවලට අදාළ නෛතික ප්‍රතිසංස්කරණවලට ක්‍රියාකාරී සංලක්ෂයන් ඒ තුළ අඩංගු වේ.

110. දේශපාලන ක්ෂේත්‍රයේ කාන්තා සහභාගීත්වය වර්ධනය කිරීම සඳහා ධනාත්මක ක්‍රියාමාර්ග ගෙන ඇත. නිදසුන් ලෙස 2016 අංක 01 දරණ පළාත්පාලන ආයතන මැතිවරණ සංශෝධන පනත මගින් පළාත් පාලන ආයතනයක සමස්ත ආසන සංඛ්‍යාවෙන් සියයට 25% ක් කාන්තා අපේක්ෂකයන්ට වෙන් කර තිබේ.

ළමුන්

(2012)127 පරිච්ඡේදයේ 70,71,72,73 හි ප්‍රකාශිත නිර්දේශ (2008)97 පරිච්ඡේදයේ ප්‍රකාශිත ස්වේච්ඡා ප්‍රතිඥාව (2013) පරිච්ඡේද 4.8,4.13,4.19 හි ප්‍රකාශිත ස්වේච්ඡා ප්‍රතිඥාවන්

111. ශ්‍රී ලංකා රජය විසින් ළමයින් සේවයේ යෙදවීම මුළිනුපුටා දැමීම සහ ළමා අපයෝජන හා සූරා කෑම සම්බන්ධ නඩු කටයුතු කඩිනම් කිරීම සඳහා ධනාත්මක ක්‍රියා මාර්ග ගෙන තිබේ.

112. අනතුරුදායක හෝ ළමයින් ශ්‍රමිකයන් ලෙස යොදා ගැනීම තහනම් වන සේවා තත්ත්වයන් පනස් එකක් (51) ඇතුළත් ලැයිස්තුවක් සම්මත කිරීම, වැනි ළමයින් සේවයේ යෙදවීම සහමුලින්ම තුරන් කිරීම සඳහා වන ධනාත්මක පියවර ශ්‍රී ලංකා රජය විසින් ගෙන ඇත. තවදුරටත් වයස අවුරුදු 14ට අඩු ළමයින් සේවයේ යෙදවීම නීතියෙන් තහනම් කර ඇත. ශ්‍රී ලංකාව තුළ ළමයින් සේවයේ යෙදවීම තහනම් කිරීම සඳහා වන ජාතික ප්‍රතිපත්තිය සකස් වෙමින් පවතින අතර, ඒ සඳහා කැබිනට් අනුමැතිය ලැබී ඇත. ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක්ද සකස් වෙමින් පවතී. එම ප්‍රතිපත්තිය මගින් 1939 අංක 31 දරණ අධ්‍යාපන ආඥාපනත යටතේ අනිවාර්යයෙන් අධ්‍යාපනය ලැබිය යුතු අවම වයස අවුරුදු 14 සිට 16 දක්වා ඉහළ නංවා ඇත.

113. කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය යටතේ පවතින කම්කරු දෙපාර්තමේන්තුව ළමයින් සේවයේ යෙදවීම යන ක්ෂේත්‍රය යටතේ වන ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ශක්තිමත් කිරීම සම්බන්ධ වගකීම දරයි. අයහපත්ම තත්ත්වයන් යටතේ ළමුන් සේවයේ යෙදවීම වැළැක්වීම සඳහා කිසිදු අයුරකින් නොඉවසා සිටීමේ රටේ ක්‍රමවේදය බලාත්මක කිරීමට දෙපාර්තමේන්තුව පියවර ගෙන තිබේ. නිදසුන් ලෙස, ළමා ශ්‍රමයෙන් නිදහස් කලාප වැඩසටහනට මුලපිරූ රත්නපුර දිස්ත්‍රික්කය තුළ ළමයින් සේවයේ යෙදවීම සාර්ථක ලෙස මුළිනුපුටා දැමීමට හැකි විය. එම දිස්ත්‍රික්කයේ අත්දැකීම් අනුසාරයෙන් මේ වන විට දිස්ත්‍රික්ක 25 තුළම ඒ හා සමාන වැඩසටහන් ක්‍රියාත්මක වෙමින් පවතී.

114. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ මූල්‍ය හා තාක්ෂණික සහාය ඇතිව 2015 වසරේදී පවත්වන ලද "ළමයින් සේවයේ යෙදවීමට නැත යන්නත් ගුණාත්මක අධ්‍යාපනයකට ඔව් යන්නත්" ("No to child labour and yes to quality education") යනාදී වැඩසටහන් මගින් ළමයින් සේවයේ යෙදවීම පිළිබඳ මහජනයාගේ දැනුවත්භාවය වර්ධනය වී ඇත. තවදුරටත්, යාපනය, කොළඹ, බදුල්ල යන දිස්ත්‍රික්කයන් හි මහජනයාගේ දැනුවත්භාවය වර්ධනය කිරීම සඳහා පාගමන් සංවිධානය කරනු ලැබිණි. ඊට අමතරව, 2016 ජූනි මසදී ළමා ශ්‍රමයට එරෙහි දිනය වෙනුවෙන් පැවති වැඩසටහනක් අතරතුර දී ගරු ජනාධිපතිතුමන් විසින් ළමුන් සේවයේ යෙදවීම කිසි ලෙසකින් හෝ ඉවසා නොසිටීමේ ප්‍රතිඥාවකට අත්සන් තබන ලදි.

115. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සහයෝගය ද සමගින්, ළමයින් සේවයේ යෙදවීම කිසි ලෙසකින් හෝ ඉවසා නොසිටීමේ ප්‍රතිපත්තිය පිළිබඳව දැනුවත් කිරීම සඳහා මාධ්‍යවේදීන් හට වැඩමුළුවක් පැවැත්වීය. කාන්තා හා ළමා කටයුතු සම්බන්ධයෙන් කටයුතු කරන පොලිස් නිලධාරිනියන් සඳහා ද එවැනිම වැඩමුළු පවත්වනු ලැබිණි.

116. ජාතික ළමා ආරක්ෂණ අධිකාරියට හා කම්කරු දෙපාර්තමේන්තුවට සෘජුව ලැබුණු ළමයින් සේවයේ යෙදවීම සම්බන්ධ පැමිණිලි, දෙපාර්තමේන්තුවේ කම්කරු නිලධාරීන් විසින් විමර්ශනය කරනු ලබයි. දෙපාර්තමේන්තුවේ මෙම කාර්යභාරය හේතුවෙන් රට තුළ ළමයින් සේවයේ යෙදවීමේ සුවිශේෂී පහත වැටීමක් පෙන්නුම් කර ඇත. මෑතකාලීන සංඛ්‍යාලේඛනවලට අනුව ගණනය කරන ලද ළමා ජනගහනයෙන් (අවුරුදු 5-17 දක්වා) සේවයේ යොදවන ලද ප්‍රතිශතය සියයට 1% කි.

117. ළමා අපයෝජන හා ලිංගික සූරකෑම සම්බන්ධ නඩු ක්‍රියාදාමයේ පවතින අභියෝග පිළිබඳව ශ්‍රී ලංකා රජය සැලකිල්ලට ගෙන තිබේ. ශ්‍රී ලංකාවේ නීතියට අනුව ළමා සාක්ෂිකරුවන්ගේ මූලික සාක්ෂි දෘශ්‍ය පටිගතකිරීම් ආකාරයෙන් ඉදිරිපත් කළ හැකිය. එසේම පොලිස් ස්ථාන හා අධිකරණ

ශාලා දෘශ්‍ය පහසුකම්වලින් සමන්විතදැයි තහවුරු කිරීම සඳහා පියවර ගනිමින් සිටියි. මේ අතර ළමා අපයෝජන හා ලිංගික සූරා කෑම සම්බන්ධ නඩු කටයුතු කඩිනම් කිරීමට අනුරාධපුරයේ විශේෂ මහාධිකරණයක් ස්ථාපිත කර ඇත.

118. තවද රජය විසින් 1939 අංක 48 දරණ ළමා හා තරුණ පුද්ගලයින් පිළිබඳ ආඥාපනත අහෝසි කිරීම යෝජනා කරමින්, ළමා ආරක්ෂණ හා යුක්තිය පසිඳලීම කෙටුම්පත ගෙන ඒමේ ක්‍රියා දාමයේ අවසන් අදියරට පැමිණ ඇත. එම කෙටුම්පත මගින් ළමයින්ගේ සුබසිද්ධියට හේතුවන පරිදි ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුගත වෙමින්, ශ්‍රී ලංකාවේ නීති පද්ධතියට ප්‍රතිපාදන ගෙන ඒමට බලාපොරොත්තු වේ. ගැටුම්වලට මැදිවූ ළමුන් හා නීතිය මෙන්ම ආරක්ෂාව හා රැකවරණය අවශ්‍ය දරුවන් හට විශේෂ ආරක්ෂාවක් ද මෙම කෙටුම්පතින් හඳුන්වා දෙයි. එසේම කාන්තා හා ළමා අමාත්‍යාංශය 2017 ජුනි 2 වැනිදා 'දරුවන්ට එරෙහි හිංසනය තුරන් කිරීමේ ජාතික හවුල්කාරීත්වය' එළිදැක්වූයේය. එසේම ශ්‍රී ලංකාව 'දරුවන්ට එරෙහි හිංසනය තුරන් කිරීමේ ගෝලීය හවුල්කාරීත්වය' සඳහා ගවේෂණ රටවල් 12න් එකක් බවට ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වූයේය. ගවේෂණ රටක් වශයෙන් ශ්‍රී ලංකාව වසර 2030 තිරසාර සංවර්ධන අරමුණු වලට අනුකූලව සියලු දරුවන් ප්‍රචණ්ඩත්වය හා සූරාකෑමෙන් තොරව වර්ධනය වන දැක්මක් සහිත නව මූලෝපායක් සකස් කර ක්‍රියාත්මක කරන බවට ප්‍රතිඥා දුන්නේය.

<u>ආබාධ සහිත පුද්ගලයින් ( විභව්‍යතා සහිත වූවන්)</u>

(2012)127 පරිච්ඡේදයේ සඳහන් නිර්දේශ- 1,90: (2008)111 හි ප්‍රකාශිත ස්වේච්ඡා ප්‍රතිඥාව (2013) 4.15 පරිච්ඡේදයේ ප්‍රකාශිත ස්වේච්ඡා ප්‍රතිඥාව

119. 2016 පෙබරවාරි මස දී, ආබාධිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය ශ්‍රී ලංකාව විසින් අපරා නුමත කරන ලදි. එය බලාත්මක කිරීම සඳහා නෛතික ප්‍රතිපාදන සකස් කරමින් පවතින අතර, 2017 සැප්තැම්බර් මස අවසානය වන විට එය කැබිනට් මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නියමිතය.

120. සමාජ සවිබල ගැන්වීමේ හා සුබ සාධන අමාත්‍යාංශය, කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍යාංශය, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය, සමාජසේවා දෙපාර්තමේන්තුව ඇතුළු රාජ්‍ය ආයතන ගණනාවක් ආබාධ සහිත පුද්ගලයින් හට රැකියා සඳහා ප්‍රවේශය පිණිස විධිවිධාන සලසා ඇත.

121. 1988 අගෝස්තු 18 අංක 27/88 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මගින් ආබාධිත පුද්ගලයින් සඳහා රැකියා අවස්ථා වැඩි කිරීමේ අවශ්‍යතාව හඳුනාගෙන ඇත. ඒ අනුව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් සියලුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා සංස්ථාවලට රාජ්‍ය සේවයේ අවම වශයෙන් 3% ක පුරප්පාඩු, සුදුසුකම් සහිත, තම කාර්යයන් ඉටුකිරීමට ආබාධිත තත්වය බාධාවක් නොවන පුද්ගලයින් බඳවා ගැනීමට කටයුතු කරන ලෙස උපදෙස් දී ඇත.

122. 2012 ජාතික මානව සම්පත් සහ සේවා නියුක්ති ප්‍රතිපත්තිය ආබාධිත පුද්ගලයින් අධ්‍යාපනය, වෘත්තීය පුහුණුව, සේවා නියුක්තිය සහ සංවර්ධන ආධාර වැඩසටහන් යනාදියට ප්‍රවේශ වීමේදී අභියෝගයන්ට මුහුණ දෙන බව හඳුනාගෙන ඇත. එම ප්‍රතිපත්තිය මගින් ආබාධ සහිත පුද්ගලයින්ට රැකියා අවස්ථාවන් උදාකරගැනීමේදී සහාය දීමට විශේෂ ක්‍රියාමාර්ග සලසා ඇත. සුදුසු භෞතික පරිසරය නිර්මාණය කිරීම හා, ආබාධිත පුද්ගලයින් රැකියාවලට බඳවා ගන්නා සේවා යෝජකයන්ට දිරිදීමනා ලබා දීම ඒ සඳහා උදාහරණ ලෙස දැක්විය හැකිය.

123. සමාජ සේවා දෙපාර්තමේන්තුව විසින් නොමිලේ විශේෂ පුහුණු මධ්‍යස්ථාන හරහා ආබාධිත පුද්ගලයන්ට වෘත්තීය පුහුණුව ලබා දෙයි. සාර්ථක අභ්‍යාසලාභීන් හට ඔවුන් පුහුණුව ලැබූ ක්ෂේත්‍රයට අදාළ මෙවලම් කට්ටලයක් හිමිවේ. තවදුරටත්, ආබාධිත පුද්ගලයින් සඳහා වන ජාතික ලේකම් කාර්යාලය හරහා ස්වයං රැකියා සහාය/ආධාර ලබා දෙයි. අඩු ආදායම්ලාභී ආබාධිත පුද්ගලයන්ට නව

ස්වයං රැකියා ආරම්භ කිරීම සඳහා හෝ දැනට පවතින ක්‍රමය වැඩි දියුණු කිරීම සඳහා රුපියල් 25,000 ක ආධාරයක් ලබා දෙයි.

124. ආබාධිත පුද්ගලයන්ට සුදුසු සේවා යෝජකයන් හා සම්බන්ධ විය හැකි පරිදි, කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය විසින් දත්ත ගබඩාවක් නිර්මාණය කර ඇත. ඕනෑම ආබාධිත පුද්ගලයෙකුට www.employmentforpwds.org වෙත ප්‍රවේශ වී රැකියා අවස්ථාවක් සඳහා ලියාපදිංචි විය හැකිය.

125. සියලුම ප්‍රසිද්ධ ගොඩනැගිලි, පොදු ස්ථාන සහ සාමාන්‍ය සේවාවන් ලබාගත හැකි ස්ථානයන්ට ප්‍රවේශවීමේ හැකියාවට සහායවීම සඳහා ආබාධිත පුද්ගලයින් (ප්‍රවේශවීමේ හැකියාව) පිළිබඳ රෙගුලාසි 2006 වසරේ ඔක්තෝබර් මාසයේ දී නිකුත් විය.

<u>අභ්‍යන්තර වශයෙන් අවතැන් වූවන් හා සරණාගතයින්</u>

(2012)127 පරිච්ඡේදයේ ප්‍රකාශිත නිර්දේශ - 91,92,93,94,95,96,97,98,99 ස්වේච්ඡා ප්‍රතිඥාවන් (2008) 106,107 පරිච්ඡේදවල ප්‍රකාශිත (2013) 4.4 පරිච්ඡේදයේ ප්‍රකාශිත ස්වේච්ඡා ප්‍රතිඥා

126. 2016 වසර අවසන් වන විට ශ්‍රී ලංකා රජය උතුරු නැගෙනහිර පළාත්වල පවුල් 253,231 ක පුද්ගලයින් 882,392 ක් ඔවුන්ගේ මුල් ගම්බිම්වල නැවත පදිංචි කරන ලදි. උතුරු පළාතේ සුභ සාධන කඳවුරු 35ක් තුළ පවුල් 1,608 කට අයත් පුද්ගලයින් 5,732 ක් තවමත් සිටින අතර, නැගෙනහිර පළාත තුළ පවුල් 172 කට අයත් පුද්ගලයින් 486 ක් සුභ සාධන කඳවුරුවල ජීවත් වෙති. තවදුරටත්, උතුරු පළාතේ පවුල් 11,073 ක්ද, නැගෙනහිර පළාතේ පවුල් 1,498 ක්ද වෙනත් පවුල් සමග ජීවත් වන අතර, එසේ ජීවත් වන පිරිස ද අවතැන්වූවන් ලෙස සැලකේ.ඒ අතර ශ්‍රී ලාංකික සම්භවයක් සහිත සරණාගතයින් 4,870 ක් ප්‍රධාන වශයෙන් ඉන්දියාවේ සිට ලංකාවට යළි පැමිණ තිබේ. එසේම 102,000 ක් පමණ වන සරණාගතයින් සංඛ්‍යාවක් තවමත් ලංකාවෙන් පිටත ජීවත් වෙති.

127. අභ්‍යන්තරව අවතැන්වූවන් සහ සරණාගතයන් දිගු කාලීනව මුහුණපාන බරපතල අභියෝගය වන්නේ, දෙවන පාර්ශ්වයක පදිංචිකරුවන් නිසා තම ඉඩම් අයිතිය අහිමිවීමේ අවදානමයි. උදාහරණයක් ලෙස යම් කෙනෙකුගේ ඉඩම් හිමිකාරීත්වය අහිමි වීම එම ඉඩම වෙනත් පාර්ශවයක් විසින් වසර දහයකට වඩා කාලාවරෝධ භුක්තිය විඳ තිබීම මත සිදුවේ. කෙසේ වෙතත්, 2016 අංක 5 දරණ කාලාවරෝධ (විශේෂ විධි විධාන ) පනත කාලාවරෝධය අදාළ කිරීමේදී කවර හෝ සන්නද්ධ කණ්ඩායමක ක්‍රියාකාරීත්වය හේතුවෙන් අවතැන්භාවයට පත් වූවන් නිදහස් කර තිබේ. ඒ අතර 2003 අංක 21 දරණ සමථ මණ්ඩල (විශේෂ වර්ගවල ආරවුල්) පනත මගින් ඉඩම් ආරවුල් නිරාකරණය කිරීමට පහසුකම් සැලසීම සඳහා යාපනය, කිලිනොච්චිය, ත්‍රිකුණාමලය, මඩකලපුව, හා අනුරාධපුරය යන ප්‍රදේශ ඉඩම් ආරවුල් සමථ කිරීම වෙනුවෙන් විශේෂ සමථ මණ්ඩල ක්‍රියාත්මක කළ හැකි ප්‍රදේශ ලෙස ගැසට් කර ඇත.

128. බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම් සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය විසින්, අවතැන් හා ගැටුම් හේතුවෙන් බලපෑමට ලක්ව අවතැන්වූ පුද්ගලයින් සඳහා කල් පවත්නා විසඳුමක් වෙනුවෙන් ප්‍රතිපත්තියක් වැඩිදියුණු කර ඇති අතර, ඒ සඳහා කැබිනට් අනුමැතියද ලැබී ඇත. එම ප්‍රතිපත්තිය මගින් අවතැන්වූවන්ගේ අයිතීන් සහ ඒ සඳහා ගත හැකි පියවර වැඩි දියුණු කිරීම සඳහා ඔවුන්ගේ කඩිනම්, මධ්‍යකාලීන හා දිගු කාලීන ආරක්ෂණ අවශ්‍යතා සැලකිල්ලට ගෙන, අවතැන්භාවයට කල්පවත්නා විසඳුමක් ලබා දීම අරමුණු කරයි.

<u>හිටපු කැරලිකරුවන්</u>

(2012)127 පරිච්ඡේදයේ ප්‍රකාශිත නිර්දේශ- 48, 49, 50 (2013) 4.5 පරිච්ඡේදයේ ප්‍රකාශිත ස්වේච්ඡා ප්‍රතිඥාව

129. 2009 මැයි මාසයේදී ගැටුම් නිමාවීමත් සමග ආරක්ෂක හමුදා වෙත භාර වූ ළමා සොල්දාදුවන් 594ක්ද, හිටපු කැරලිකරුවන් 12,156 ක්ද යළි සමාජගත කිරීමට සහාය දීම පිණිස සකස් වූ වසරක

පුනරුත්ථාපන වැඩසටහනක් සඳහා යොමු විය. හිටපු සොල්දාදුවන් හා ළමා සොල්දාදුවන් සමාජය හා යළි සමාජගත වී සිටියි. ආධ්‍යාත්මික, සමාජ-මනෝවිද්‍යාත්මක, පෞරුෂ හා නායකත්ව පුහුණුව යන ක්ෂේත්‍ර යටතේ මාස හයක පුහුණු කාලයක්ද, ඉතිරි මාස හය වෘත්තීය හා තාක්ෂණික පුහුණුව, පෙදරේරු කර්මාන්තය, වඩු කර්මාන්තය හා තොරතුරු තාක්ෂණය ආදී ක්ෂේත්‍ර ඔස්සේ ලබා දීම පුනරුත්ථාපන ක්‍රියාවලියේ උපක්‍රම හා ක්‍රියා මාර්ගයන්ට ඇතුලත් වේ.

130. පුනරුත්ථාපන අධිකාරිය විසින් 2012 හා 2013 වසරවලදී අදාළ කොමසාරිස් ජනරාල්වරයා විසින් පුනරුත්ථාපනය කරන ලද හිටපු කැරලිකරුවන් 1799 කට ස්වයං රැකියා ණය ප්‍රදානය කෙරිණ.

131. අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටි හිටපු කැරලිකරුවන් 361 දෙනෙකුගෙන් 212 දෙනෙකු විභාගයෙන් සමත් වී ඇති අතර, ඉන් අයදුම්කරුවන් 65 දෙනෙකු හිටපු කාන්තා සොල්දාදුවන්ය. අධ්‍යන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයට පෙනී සිට 2010 වසරේදී විශ්ව විද්‍යාල ප්‍රවේශය ලබා ගත් හිටපු කැරලිකරුවන් සංඛ්‍යාව 37 කි. ඉන් 29 දෙනෙක් කාන්තා සොල්දාදුවන්ය. හිටපු ළමා හා කාන්තා කැරලිකරුවන් සමාජගතවීමේ ක්‍රියාවලියේ සැලකිය යුතු ප්‍රගතියක් සිදුව තිබේ. සමස්තයක් ලෙස හිටපු කැරලිකරුවන් හය දෙනෙක් පුනරුත්ථාපනය වීමට ඉතිරිව සිටින අතර, ඔවුන් පුනරුත්ථා පනයෙන් අනතුරුව 2017 දෙසැම්බර් මස යළි සමාජගත වනු ඇත. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අධිචෝදනා ඉදිරිපත් කරනු ලැබීම වෙනුවට පුනරුත්ථාපනය ලැබීමේ විකල්පය හිටපු කැරලිකරුවන්ට ලබා දී ඇති අතර, ඒ හේතුව මත පුනරුත්ථාපනය පිණිස තවත් ඉදිරිපත් වේ යයි අපේක්ෂා කළ හැක.

**මතුවෙමින් පවතින කරුණු සහ ජාත්‍යන්තරයේ සහාය**

<u>මතුවෙමින් පවතින කරුණු</u>

132. ශ්‍රී ලංකාවේ කාලාන්තරීය විශ්ව විමර්ශන වාර්තාවේ දෙවන වටයේදී මානව හිමිකම්වලට අදාළ වැදගත් කරුණු කිහිපයක් පැන නැගුණි. තිරසාර සංවර්ධන ඉලක්කවලින් මුදුන්පත්වන ගෝලීය තිරසාර සංවර්ධන න්‍යායපත්‍රය ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ප්‍රවර්ධනය හා ආරක්ෂා කිරීම සම්බන්ධ ප්‍රතිපත්ති සඳහා උපකාරී වී ඇත. මේ සම්බන්ධයෙන් සහශ්‍ර සංවර්ධන අරමුණු අංක 16 විශේෂයෙන් අදාළ වේ. එහි අරමුණ වන්නේ තිරසාර සංවර්ධන ඉලක්ක තුළ අන්තර්ගත මානව හිමිකම්වලට විශෙෂයෙන්ම අදාළ වුණු සාමය ප්‍රවර්ධනය හා තිරසාර සංවර්ධනය වෙනුවෙන් සමාජයන් අන්තර්ග්‍රහණය, යුක්තිය සඳහා සැමට ප්‍රවේශය සැපයීම සහ ඵලදායී, වගකීම් සහගත හා අන්තර්ග්‍රහණය වූ ආයතන සෑම තලයකම ගොඩ නැගීමයි.

a. ජාතික නෛතික ප්‍රතිපාදන සහ ජාත්‍යන්තර ගිවිසුම් හා අනුකූල වන පරිදි ජාත්‍යන්තර සහයෝගීතාව තුළින් තොරතුරුවලට මහජනයාට ඇති ප්‍රවේශය සහතික කිරීම සහ මූලික නිදහස ආරක්ෂා කිරීම

b. ජාත්‍යන්තර සහයෝගීතාව මගින් සියලුම මට්ටම්වල ධාරිතා සංවර්ධනය, විශේෂයෙන්ම සංවර්ධනය වෙමින් පවතින රටවල, හිංසනය මැඩපැවැත්වීම සහ ත්‍රස්තවාදය හා අපරාධවලට එරෙහිව සටන්කිරීමට අදාළ ජාතික ආයතන ශක්තිමත් කිරීම

133. මෙම ජාතික වාර්තාවේ පැහැදිලි කර ඇති ක්‍රියාමාර්ග සහ වැඩසටහන් සහශ්‍ර සංවර්ධන අරමුණු අංක 16 සාක්ෂාත් කර ගැනීමට දායකත්වය දක්වයි.මේ සම්බන්ධයෙන් වඩාත් කැපී පෙනෙන කාරණය නම් ශ්‍රී ලංකා රජය විසින් තිරසාර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් හා උපාය මාර්ගයක් සැලසුම් කර හා සංවර්ධනය කර එය ක්‍රියාත්මක කිරීමත් වගකිව යුතු සියලු ආයතන විසින් වසර 2015 දී එක්සත් ජාතීන් විසින් සම්මත කරගත් තිරසාර සංවර්ධන අරමුණු 17හිත් ඒ ආශ්‍රිත ඉලක්ක 169හිත්ප්‍රගතිය ගැන පසුවිපරම් හා නිරීක්ෂණය කිරීමට පහසුකම් සැලසීමත්ය. මේ අනුව, තිරසාර සංවර්ධනය සඳහා ජාතික ප්‍රතිපත්ති හා උපාය මාර්ග සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා වන නීති කෙටුම්පතක් 2016 ජූලි මසදී අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී. මෙම ශ්‍රී

ලංකා තිරසාර සංවර්ධන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව විසින් නොබෝ දිනකින් සලකා බලනු ඇත.

134. දෙවනුව, 2012 වර්ෂයේ සිට මෙරට තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් ගැටලු පැන නැගී ඇත. වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන න්‍යාය පත්‍රය කේන්ද්‍ර වන්නේ විධායක ජනාධිපතිධුරයේ බලය සංශෝධනය කිරීම, ඵලදායීව බලය බෙදා හැරීමේ සැලසුමක් බලය බෙදා හැරීම හරහා ලබා දීම සහ සමානුපාතික නියෝජන ක්‍රමයේ සිට මිශ්‍ර නියෝජන ක්‍රමයට මාරුවෙමින් මැතිවරණ ක්‍රමය සංශෝධනය කිරීම යන කාරණා මතයි. මෙම සංශෝධනවල ඉලක්ක වන්නේ ප්‍රජාතාන්ත්‍රික වගවීම, රාජ්‍ය පාලනයේ සිටින පුද්ගලයින්ගේ ස්වාධීනත්වය වර්ධනය කිරීම සහ ඡන්දය දීමේ අයිතිය වර්ධනය කිරීමයි. මෙම ප්‍රමුඛතාවන් වත්මන් 2017-2021 ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්ම තුළින් නිරූපණය වේ.

135. තෙවනුව, කාලගුණ විපර්යාස සහ මානව හිමිකම් සමඟ ඒවායේ සම්බන්ධතාවය ශ්‍රී ලංකා රජයේ ප්‍රමුඛ අවධානයට ලක්වූ පැති කඩක් ලෙස මතුව ඇත. එක්සත් ජාතීන්ගේ මහ සමුළුවේ 71 වන සැසි වාරයේදී ගරු ජනාධිපතිතුමන් පාරසරික තිරසාරත්වයේ වැදගත්කම ඉස්මතු කළේය. කාලගුණ විපර්යාස මානව හිමිකම් මත බලපෑම් සිදු කරන බැවින්, ශ්‍රී ලංකා රජය මානව හිමිකම් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම පාරිසරික ප්‍රතිපත්ති හා ආපදා ප්‍රතිචාර උපක්‍රම තුළට අන්තර්ග්‍රහණය කිරීමට කැපවී සිටියි.

136. ශ්‍රී ලංකා රජය විසින් ගෙන ඇති ප්‍රතිපත්තිමය තීරණයක් අනුව, ශ්‍රී ලංකාව 2015 දී විවෘත රාජ්‍ය සහයෝගිතාවට එකතු වූ අතර, ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම, යහපාලනය, විනිවිදභාවය, නීතියේ ආධිපත්‍යය හා දූෂණයට එරෙහිවීම ශක්තිමත් කිරීම අරමුණු කරගත් ජාතික ක්‍රියාකාරී සැලැස්ම සම්මත කර ගත්තේය.

<u>එක්සත් ජාතීන්ගේ සහයෝගීතාව සහ සහාය</u>

(2012)127 පරිච්ඡේදයේ ප්‍රකාශිත නිර්දේශ- 43,44,47, සහ (2012) 128 පරිච්ඡේදයේ- 43,44,45,46,47,48,50,51,52 (2008)88 පරිච්ඡේදයේ ප්‍රකාශිත ස්වේච්ඡා ප්‍රතිඥාව (2013) 4.7 පරිච්ඡේදයේ ප්‍රකාශිත ස්වේච්ඡා ප්‍රතිඥාව

137. ශ්‍රී ලංකාව අන්තර්ජාතික ප්‍රජාවෙන් හා එක්සත් ජාතීන්ගෙන් බලාපොරොත්තු වුණු සහාය රටට හිමිව තිබේ. 2015 නොවැම්බර් මාසයේ දී ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ සාමය ගොඩනැගීමේ අරමුදලේ, දිගු කාලීන සාමය ගොඩ නැගීමේ ප්‍රතිපාදන පහසුකමේ, මූල්‍යමය සහාය හිමිකරගැනී මට සුදුසකම් ලැබීය. එක්සත් ජාතීන් හා රජය එතැන් සිට සාමය ගොඩ නැගීමේ ප්‍රමුඛතා සැලැස්ම වර්ධනය කිරීමට හා ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබිණි.

138. ශ්‍රී ලංකා රජය සමග එක්සත් ජාතීන්ගේ ආයතන හා ක්‍රියාවලීන් අතර සහයෝගීතාව, පසු ගිය වසර දෙක ඇතුළත සුවිශේෂී අයුරින් වර්ධනය වී ඇත. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ 30/1 හා 34/1 යන යෝජනාවන්ට සම අනුග්‍රහය දැක්වීමේ ඓතිහාසික කාරණාව හැරුණු කොට, ශ්‍රී ලංකා රජය එක්සත් ජාතීන්ගේ සම්මුතිවලට අදාළ වාර්තා කිරීමේ බැඳීම ඉටු කර තිබේ. එමෙන්ම එක්සත් ජාතීන්ගේ විශේෂ ක්‍රියා පටිපාටීන් හා මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් වරයා සමග සහයෝගයෙන් කටයුතු කර තිබේ. ශ්‍රී ලංකා රජයේ ආරාධනයකට අනුව මහකොමසාරිස් සෙයිද් රාද් අල් හුසේන් කුමරු 2015 පෙබරවාරි මස 06 වෙනි දා සිට 09 වෙනිදා දක්වා මෙරට සංචාරයක නිරත විය. සත්‍ය, යුක්තිය, හානිපූරණය හා නැවත සිදු නොවීම් සහතික කිරීම, විනිසුරුවරුන්ගේ සහ නීතිඥවරුන්ගේ ස්වාධීනත්වය, වධ හිංසා සහ අනෙකුත් කෲර අමානුෂික සැළකිලි සහ දඬුවම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිතයන් මෙන්ම බලහත්කාරයෙන් අතුරුදන් කරවීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරී කණ්ඩායම පසුගිය වසර දෙක ඇතුළත ශ්‍රී ලංකාවේ සංචාරය කරන ලදි. එසේම එක්සත් ජාතීන්ගේ සියලුම විශේෂ බලතල දරන්නන් සඳහා විවෘත ආරාධනයක් 2015 දෙසැම්බර් 17 වනදා සිදු කරනු ලැබිණි.